වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2025



මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

மனிதவலு மற்றும் வேலைவாய்ப்புத் திணைக்களம்

DEPARTMENT OF MANPOWER & EMPLOYMENT

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය - 328

පටුන

	පිටු අංකය
1. **පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	
1.1 හැදින්වීම	4
1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු	5
1.3 සංවිධාන සටහන	6
1.4 කාර්ය මණ්ඩල තොරතුරු	7
1.5 දෙපාර්තමේන්තුවේ අංශ	9
1.6 දෙපාර්තමේන්තුවේ අංශයන්හි කාර්යභාරය	10
2. **පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	
2.1 මූල්‍ය ප්‍රගතිය	14
2.2 භෞතික ප්‍රගතිය	15
2.3.ආංශික ප්‍රගතිය	17
2.4 ඉදිරි සැලසුම්	39
3. පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	
3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	42
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	44
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	46
3.4 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	48
3.5 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය	48
3.6 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	48
3.7 විගණන වාර්තාව	49
4. පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක	
4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක	56
5. පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය	
5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු	58
6. පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	62
6.2 ආයතනයේ කාර්යසාධනය සඳහා පුහුණු වැඩසටහන්	62
7. පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	66

01

පරිච්ඡේදය

ආයතනික පැතිකඩ, ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1. හැදින්වීම

මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010 වර්ෂයේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලද අතර වර්තමානයේ කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරන ලද මෙම දෙපාර්තමේන්තුව සඳහා රැකියා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම, රැකියා සැලසුම්කරණය, සේවා නියුක්තිය හා ශ්‍රම වෙළඳපොළ තොරතුරු, වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන් යන විෂයන් නිශ්චය කරනු ලැබිණි. මීට අමතරව දෙපාර්තමේන්තුව වෙත මහජන රැකියා සේවාවන් පවත්වාගෙන යාම හා ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

මෙම දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය මගින් සිදුකරන ලද සමීක්ෂණ තොරතුරු උපයෝගී කර ගනිමින් වෘත්තීය මාර්ගෝපදේශයට හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනයට අදාළව නිර්මාණාත්මක වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත. එමගින් ප්‍රතිලාභීන් විශාල සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබා දෙමින් හා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රැකියා කේන්ද්‍රයන් හරහා මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා රැකියා විරහිත තරුණ තරුණියන් හට පෞද්ගලික අංශයේ රැකියා ලබා දීම සිදු කරනු ලැබේ.

අප දෙපාර්තමේන්තුවේ දීර්ඝ කාලීන ඉලක්ක පහත පරිදි වේ.

1. ගෝලීය වශයෙන් තරගකාරී, නිපුණතාවයෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ගොඩ නැංවීම
2. විරැකියාව අවම කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
3. සංවිධිත පරිපූර්ණ ශ්‍රම වෙළඳපල තොරතුරු පද්ධතියක් ඇති කිරීම


1.1 ප්‍රධාන කාර්යයන්


2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන පරිදි දෙපාර්තමේන්තුව ස්ථාපිත ගැසට් නිවේදනය මගින් දෙපාර්තමේන්තුව වෙත පහත සඳහන් කාර්යයන් පැවරී ඇත.

1. ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
2. රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු
3. වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු
4. ශ්‍රම වෙළඳපල තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම
5. මහජන රැකියා සේවයට අදාලව සිදු කෙරෙන සියලු සේවාවන්

මෙහි පළමු කාර්යය ලෙස දක්වා ඇති ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම ජාතික මානව සම්පත් සංවර්ධන සභාව වෙත පැවරී ඇති බැවින්, එහි පාර්ශවකාර ආයතනයක් ලෙස ඉහත අරමුණු ඉටු කර ගැනීමට දායකත්වය ලබා දීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු






අරමුණු

1. ශ්‍රම වෙළඳපොළ තුළ සිටින සහ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත ප්‍රජාව සඳහා කුසලතා සංවර්ධනය පිළිබඳ මහපෙන්වීම.
2. වර්තමාන ශ්‍රම බලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියළුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
3. රැකියා අපේක්ෂිතයින් ව්‍යවසායකත්වය සඳහා පෙළඹවීම.
4. පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂිතයින් යොමු කිරීම.
5. ආබාධිත පුද්ගලයින් හා ඌන සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයින් ඇතුළු අවධානමට ලක්වූ කණ්ඩායම් සඳහා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීමට කටයුතු කිරීම.
6. ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියළුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම.
7. දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ නැමියාවන් පුරෝකථනය.

විරැකියාව අවම කිරීම හා සුනිසි රැකියා ඇතිකිරීම ඇතුළු ඉහත අරමුණු ඉටුකරගැනීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව සිය මානව සම්පත් උපයෝගී කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන (2025)



1.4 කාර්ය මණ්ඩල තොරතුරු - 2025.12.31 දිනට

අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු - 2025.12.31 දිනට

අනු අංකය	තනතුර	අදාළ වන සේවය	අනුමත	තත්‍ය	පුරප්පාඩු
1	අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ල.ප.සේ (විශේෂ)	1	1	0
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ල.ප.සේ (විශේෂ)	1	1	0
3	අධ්‍යක්ෂ (පාලන)	ශ්‍රී.ලං.ප.සේ I	1	1	0
4	අධ්‍යක්ෂ (රැ. නි, ප්‍ර. හා වෘ. මා.)	ශ්‍රී.ලං.ප.සේ I	1	1	0
5	අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ)	ශ්‍රී.ලං.ක්‍ර.සේ I	1	0	1
6	අධ්‍යක්ෂ(මානව සම්පත් කළමනාකරණ)	ශ්‍රී.ලං.ප.සේ I	1	1	0
7	අධ්‍යක්ෂ(මහජන රැකියා සේවය)	ශ්‍රී.ලං.ප.සේ I	1	0	1
8	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ I	1	1	0
9	නි. අධ්‍යක්ෂ (මානව සම්පත් කළමණාකරණ)	ශ්‍රී.ලං.ප.සේ II/III	2	0	2
10	නි. අධ්‍යක්ෂ (සැලසුම් හා ප්‍රගති මෙහෙයුම්)	ශ්‍රී.ලං.ක්‍ර.සේII/III	1	1	0
11	නි.අධ්‍යක්ෂ (ශ්‍රම වෙ. තො. හා පර්යේෂණ)	ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III	1	1	0
12	නි.අධ්‍යක්ෂ(මහජන රැකියා සේවය)	ශ්‍රී.ලං.ප.සේ II/III	1	1	0
13	ස.අධ්‍යක්ෂ (පාලන)	ශ්‍රී.ලං.ප.සේ II/III	2	0	2
14	ස.අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ, ප්‍රවර්ධන)	ශ්‍රී.ලං.ප.සේ II/III	1	0	1
15	සහකාර අධ්‍යක්ෂ (වෘත්තීයමාර්ගෝපදේශ)	ශ්‍රී.ලං.ප.සේ II/III	1	0	1
16	ගණකාධිකාරී (වැටුප් රහිත විදේශ නිවාඩු)	ශ්‍රී.ලං.ග.සේ II/III	1	1	0
17	අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේII/III	1	0	1
18	නීති නිලධාරී	දෙ. ගත II/III	1	0	1
19	පරිපාලන නිලධාරී	රා.කළ.සේ.අධි	1	1	0
20	භාෂා පරිවර්තක (සිංහල-දෙමළ)	භාෂා පරිවර්තක සේවයII/I	2	0	2
21	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ශ්‍රී ලං.තො.ස.තා.සේ I/II/III	1	0	1
22	සංඛ්‍යා ලේඛන නිලධාරී	ක්ෂේත්‍ර ගත/කාර්යාල ගතII/I	1	0	1
23	වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරින්	ආශ්‍රිත සේවය III/II/ I	22	22	0
24	ව්‍යාපෘති නිලධාරින්	ආශ්‍රිත සේවය III/ II/ I	3	3	0
25	මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරින්	ආශ්‍රිත සේවය III/ II/ I	4	4	0
26	සංවර්ධන නිලධාරින්	සං. නි. සේවය III/ II/ I	554	538	16
27	රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරින්	රා.කළ.සේ III/ II/ I	35	18	17

අනු අංකය	තනතුර	අදාළ වන සේවය	අනුමත	තත්‍ය	පුරප්පාඩු
28	රියදුරු	රියදුරු සේවයIII/ II/ I/විශේෂ	8	7	1
29	කාර්යාල කාර්ය සහායක	කා. සේ. සේවය III/ II/ I/විශේෂ	7	5	2
	එකතුව		**658**	**608**	**50**

ස්ථාන මාරු ලැබ දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වූ මාණ්ඩලික නිලධාරීන්

අනු අංකය	නම	තනතුර	සේවයට පැමිණි දිනය
01	පී.වී.ඒ.වික්‍රමරත්න මිය	අධ්‍යක්ෂ (රෝ. නි, ප්‍ර. හා වෘ. මා)	2025.03.14
02	එච්.එල්.සී.එන්.සෙව්වන්දි මිය	අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ)	2025.03.24
03	ඩබ්.ජී.එස්.ආර්.වික්‍රමසිංහ මිය	ප්‍රධාන ගණකාධිකාරී	2025.04.29

ස්ථාන මාරු ලැබ දෙපාර්තමේන්තුවෙන් බැහැර වූ මාණ්ඩලික නිලධාරීන්

අනු අංකය	නම	තනතුර	ස්ථාන මාරු ලැබූ දිනය
01	බී.එස්.එන්.පෙරේරා මයා	අධ්‍යක්ෂ(සැලසුම් හා පර්යේෂණ)	2025.01.01
02	එන්.සංජීපන් මයා	සහකාර අධ්‍යක්ෂ (පාලන)	2025.03.21
03	එච්.එල්.සී.එන්.සෙව්වන්දි මිය	අධ්‍යක්ෂ(සැලසුම් හා පර්යේෂණ)	2025.09.04

1.5 දෙපාර්තමේන්තුවේ අංශ

අනු අංකය	අංශය	හැඳින්වීම
01	පාලන අංශය	දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටුකිරීම උදෙසා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට දායකවීම තුලින් විශිෂ්ඨ කාර්යසාධනයක් ළඟා කරගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරිත්වයට සහාය වීම පිණිස ආයතන කටයුතු හා සාමාන්‍ය පරිපාලන කටයුතු මෙහෙයවීම සිදු කරයි.
02	ගිණුම් අංශය	දෙපාර්තමේන්තුවේ මුල්‍ය පරිපාලනමය කටයුතු මෙම අංශය මගින් සිදු කරයි. වැටුප් හා වේතන ගෙවීම, සමස්ත මූල්‍ය ප්‍රවාහය කළමනාකරණය, ගබඩා කළමනාකරණය හා විගණන නිලධාරීන් වෙත තොරතුරු සැපයීම සිදු කරයි.
03	අභ්‍යන්තර විගණන අංශය	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38(1) ඊ වගන්ති ප්‍රකාරව ගණන්දීමේ නිලධාරීගේ වගකීම යටතේ අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුවේ සෑම අංශයකම රාජකාරී කටයුතු ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට අනුව සිදුවනවාද යන්න සොයාබැලීම තුළින් අතපසු වීම්, වැරදි සහ අඩුපාඩු හඳුනාගැනීම මඟින් දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු සඳහා සහාය වීම සිදු කරයි.
04	සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය	දෙපාර්තමේන්තුවේ විවිධ සැළසුම් සකස් කිරීම, දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සේවයේ යෙදෙන නිලධාරීන් වෙත වාර්ෂික ඉලක්ක ලබාදීම, නිලධාරීන්ගේ භෞතික හා මුල්‍ය ප්‍රගතිය ලබා ගනී. එම තොරතුරු විශ්ලේෂණය, ප්‍රගති වාර්තා සකස් කර අවශ්‍ය පාර්ශවයන් වෙත ඉදිරිපත් කිරීම මඟින් දෙපාර්තමේන්තුවේ කළමනාකරණයට සහය වීම සිදු කරයි.
05	ශ්‍රම වෙළඳපොළ තොරතුරු හා පර්යේෂණ ඒකකය	ජාතික ශ්‍රම වෙළඳපොල පිළිබඳ කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීම සඳහාත්, ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහාත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන්, පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයින් සඳහාත් අවශ්‍ය ශ්‍රම වෙළඳපොළ තොරතුරු භාවිතයට පහසු වන ආකාරයෙන් සියළු පාර්ශවකරුවන් වෙත තොරතුරු සම්පාදනය සිදුකරයි.
06	රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය	සේවාලාභීන්ගේ වෘත්තීය වරණය හා වෘත්තීය සංවර්ධනය සඳහා නිවැරදි වෘත්තීය මාර්ගෝපදේශ සේවාවන් ලබා දෙමින් ශ්‍රම බලකාය නිපුණ හා ගෝලීය ශ්‍රම වෙළඳපොලට ගැලපෙන ආකාරයෙන් ගොඩනැගීමට දායකත්වය ලබා දීම සිදු කරයි.
07	මානව සම්පත් කළමනාකරණ අංශය	ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය මෙරට තුළ ක්‍රියාත්මක කරවීමට හා අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීමට අවශ්‍ය මැදිහත්වීම හා අදාල ආයතන වෙත සහාය ලබාදීම. දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළව ජාතික හා ජාත්‍යන්තර ආයතන විසින් මෙරට ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සම්බන්ධීකරණ කිරීම. දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත ශ්‍රම වෙළඳපොලට අදාළ තොරතුරු, දැනුම ලබාදීම හා දෙපාර්තමේන්තුවේ වැඩසටහන් ප්‍රචාරණ කටයුතු මෙහෙයවීම සිදු කරයි.
08	මහජන රැකියා සේවා අංශය	ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය සඳහා පුද්ගලික අංශයේ ඵලදායී රැකියා අවස්ථාවන් කාර්යක්ෂම ලෙස ලබාදීම අරමුණු කරගෙන දිස්ත්‍රික්ක 25 හි ස්ථාපිත මහජන රැකියා සේවා මධ්‍යස්ථාන කළමනාකරණය සිදු කරයි.

1.6 දෙපාර්තමේන්තුවේ අංශයන්හි කාර්යභාරය

අනු අංකය	අංශය	කාර්යභාරය
01	පාලන අංශය	1. නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම 2. නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම 3. ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම 4. දෛනික තැපෑල 5. බඳවා ගැනීම්, විනය පාලනය, දෙපාර්තමේන්තු මෙහෙයුම් පරිපාලන කටයුතු 6. ප්‍රවාහන කටයුතු
02	ගිණුම් අංශය	1. වැටුප් හා වේතන ගෙවීම 2. සමස්ත මූල්‍ය ප්‍රවාහය කළමනාකරණය 3. ගබඩාකරණය 4. විගණන නිලධාරීන් වෙත තොරතුරු සැපයීම
03	අභ්‍යන්තර විගණන අංශය	1. විශේෂ විමර්ශණ කටයුතු 2. දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම හා පූර්ව හා පසු කටයුතු 3. අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම හා පූර්ව හා පසු කටයුතු 4. අවදානම් ලේඛනය හා අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම 5. අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව කටයුතු කිරීම 6. පසු විපරම් වාර්තා සකස් කිරීම
04	සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය	1. දෙපාර්තමේන්තුවේ සියළුම අංශ සහභාගි කර ගනිමින් උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම. 2. දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික සැලැස්මට අනුකූලව සියළුම අංශ සහභාගී කරගනිමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඊට අනුකූලව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර සිටින නිලධාරීන් සඳහා වාර්ෂික ඉලක්ක ලබා දීම. 3. ව්‍යාපෘති යෝජනා සකස් කිරීම හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම 4. දෙපාර්තමේන්තුවේ මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම 5. වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා යොමු කිරීම 6. වාර්ෂිකව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමට අනුයුක්ත කර සිටින දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ප්‍රගතිය ඇගයීම 7. පහත සඳහන් රැස්වීම් පැවැත්වීම/අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

අනු අංකය	අංශය	කාර්යභාරය
		• දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ රැස්වීම් • අර්ධ වාර්ෂික හා වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් • දිස්ත්‍රික් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම • අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම • අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම • කලමණාකරණ විගණන කමිටු රැස්වීම - දෙපාර්තමේන්තුව • කලමණාකරණ විගණන කමිටු රැස්වීම -අමාත්‍යාංශය 8. දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර සිටින දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම.
05	ශ්‍රම වෙළඳපොළ තොරතුරු හා පර්යේෂණ ඒකකය	1. අධ්‍යයන වාර්තා සකස් කිරීම 2. පාර්ශවකාර ආයතන සමඟ විවිධ සංවාදශීලී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 3. ශ්‍රම වෙළඳපොළ අධ්‍යයන වාර්තා සකස් කිරීම 4. මාසික පුවත්පත් සඟරා සකස් කිරීම 5. ශ්‍රම වෙළඳපොළ තොරතුරු සමාජගත කිරීම
06	රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය	1. වෘත්තීය මාර්ගෝපදේශ සේවා ලබාදීම (රැකියා අපේක්ෂිතයින්, දෙමාපියන්, ගුරුවරුන් සඳහා) 2. ස්වයං රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන් පැවැත්වීම 3. පාසල් සිසුන් සඳහා වෘත්තීය අධ්‍යාපනයට අදාළ ආයතන සම්බන්ධව අත්දැකීම් ලබාදීම 4. රැකියා අපේක්ෂිතයින් සඳහා වැඩලෝකය පිළිබඳව අත්දැකීම් ලබාදීම 5. පුහුණුවක, රැකියාවක හෝ අධ්‍යාපනයක නිරත නොවන කණ්ඩායම් ඇතුළු අවධානම් සහගත තරුණ ප්‍රජාව රැකියා කිරීමට පෙළඹවීම 6. අවිධිමත් අංශයේ ශ්‍රමිකයන් සවිබල ගැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 7. වෘත්තීය මාර්ගෝපදේශ අත්පොත් යාවත්කාලීන කිරීම
07	මානව සම්පත් කළමනාකරණ අංශය	1. ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය යටතේ එක් එක් ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයට සම්බන්ධ අදාළ ආයතන වෙත නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම 2. ශ්‍රී ලංකාවේ මානව සම්පත් කළමනාකරණය හා ඵලදායී භාවිතය පිළිබඳ නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම 3. අවිධිමත් අංශයේ සේවකයින්/ රැකියා අපේක්ෂිතයින්සඳහා ඩිජිටල් අලෙවිකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම 4. ආබාධිත තරුණ ප්‍රජාව රැකියාගත කිරීම 5. මාර්ගගත රැස්වීම් සඳහා පහසුකම් සැලසීම 6. දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය කළමනාකරණය කිරීම

අනු අංකය	අංශය	කාර්යභාරය
		7. දෙපාර්තමේන්තුව සතුව පවතින සමාජ මාධ්‍ය ජාලා (FB, YouTube, Twitter, linkedin, TikTok) පවත්වාගෙන යාම 6. ගෝලීය වශයෙන් පවතින රැකියා වෙළඳපොළ හා අනාගත රැකියා අවස්ථා පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම. 7. දෙපාර්තමේන්තු විෂය පථයට අදාළව ජාතික හා ජාත්‍යන්තර සංවිධාන විසින් මෙහෙයවන වැඩසටහන්/ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම
08	මහජන රැකියා සේවා අංශය	1. මාර්ගගත ක්‍රමයට දිස්ත්‍රික් මට්ටමින් රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම 2. මාර්ගගත ක්‍රමයට පුද්ගලික අංශයේ රැකියා සපයන ආයතන ලියාපදිංචි කිරීම හා එම ආයතන වල පවතින රැකියා පුරප්පාඩු ලියාපදිංචි කර ගැනීම 3. ලියාපදිංචි රැකියා අපේක්ෂිතයින් රැකියා සඳහා යොමු කිරීම 4. දිස්ත්‍රික් වෘත්තීය පොළ/ රැකියා පොළ පැවැත්වීම 5. ප්‍රාදේශීය වෘත්තීය පොළ/ රැකියා පොළ පැවැත්වීම 6. දේශීය/විදේශීය රැකියා පුරප්පාඩු හා නව ප්‍රවණතා පිළිබඳ රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම 7. සති අන්ත පුවත්පත් වල පවතින රැකියා පුරප්පාඩු පිළිබඳව රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම 8. පුද්ගලික ආයතන සමඟ සම්බන්ධීකරණය පුළුල් කරගැනීම සඳහා සේවායෝජක සමුළු පැවැත්වීම

02


පරිච්ඡේදය


ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 මූල්‍ය ප්‍රගතිය 2025.12.31 දිනට

අයිතමය	2025 අයවැය ප්‍රතිපාදනය (රු.මි)	අමතර ප්‍රතිපාදන	FR 66 ප්‍රතිපාදන මාරු කිරීම	2025 මුළු ප්‍රතිපාදන (රු.මි)	වියදම (රු.මි)	ඉතිරි ප්‍රතිපාදනය (රු.මි)	ප්‍රතිශතය (%)
පුනරාවර්තන වියදම්	600.000	30.000	(4.000)	626.000	621.711	4.289	99%
ප්‍රාග්ධන වියදම් (1+2)	22.000		4.000	26.000	25.011	0.989	96%
1. මෙහෙයුම්	7.000		4.000	11.000	10.421	0.579	94%
2. සංවර්ධන	15.000			15.000	14.590	0.410	97%
එකතුව	**622.000**	**30.000**	**-**	**652.000**	**646.722**	**5.275**	**99%**






2.2 භෞතික ප්‍රගතිය 2025.12.31 දිනට



	වැඩසටහන/ ක්‍රියාකාරකම	වැඩසටහන්		ප්‍රතිලාභීන්		මූල්‍ය	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය	ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)
1	දිස්ත්‍රික් වෘත්තීය පොළ/ රැකියා පොළ පැවැත්වීම	26	26	8,000	10,624	1.045	1.043
2	ප්‍රාදේශීය වෘත්තීය පොළ/ රැකියා පොළ පැවැත්වීම	202	226	20,000	25,354	4.040	3.973
3	සේවා යෝජක සමූළු පැවැත්වීම	3	3	150	154	0.215	0.222
4	රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම	70	81	2,800	2,861	1.600	1.598
5	9 වසර සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන (පාසල් සංඛ්‍යාව)	2,000	2,085	50,000	69,624	-	-
6	අ.පො.ස සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන (පාසල් සංඛ්‍යාව)	2,000	2,518	50,000	75,685	-	-
7	අ.පො.ස උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන (පාසල් සංඛ්‍යාව)	1,000	1,199	25,000	37,900	-	-
8	උසස් පෙළ සිසුන් සඳහා වැඩලෝකයට නිපුණත්වයෙන් යුතුව පිවිසීම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමේ වැඩසටහන	19	19	1,250	1,512	0.925	0.872
9	තරුණ තරුණියන් බල ගැන්වීමේ වැඩසටහන (Empower Youth)	60	66	2,400	2,439	2.100	2.033
10	NEET Group සමීක්ෂණයේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව	-	-	1,500	3,155	-	-
11	රැකියා අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම	-	-	30,000	36,180	-	-



	වැඩසටහන/ ක්‍රියාකාරකම	වැඩසටහන්		ප්‍රතිලාභීන්		මූල්‍ය	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය	ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)
12	රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම	-	-	50,000	69,984	-	-
13	රැකියා ඇබෑර්තු ලියාපදිංචි කිරීම	-	-	20,000	64,581	-	-
14	රැකියා අපේක්ෂිතයන් රැකියා සඳහා යොමු කිරීම	-	-	20,000	19,824	-	-
15	රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කිරීම	-	-	10,000	6,310	-	-
16	රැකියා අපේක්ෂිතයන් පුහුණුව සඳහා යොමු කිරීම	-	-	8,000	11,757	-	-
17	ශ්‍රම වෙළඳපොළ සමීක්ෂණ සිදු කිරීම	100%	95%	-	-	0.300	0.284
18	ඩිජිටල් අලෙවිකරණ වැඩසටහන්	100	97	4,000	5,089	4.475	4.305
සුනිසි මෙහෙවර							
19	අවිධිමත් අංශයේ සේවයේ නියුතු ශ්‍රමිකයින්හට සේවා ගරුත්වය හිමිකර දීම සඳහා වැඩසටහන	15	16	525	544	0.599	0.595


2.3 ආංශික ප්‍රගතිය - 2025.12.31 දිනට

2.3.1 ශ්‍රම වෙළඳපොළ තොරතුරු අංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
01	පුවත්පත් පාදකව ඉල්ලුම සහිත ඇබෑර්තු විශ්ලේෂණය	මෙම අධ්‍යයනය මගින් දේශීය රැකියා වෙළඳපොල තුල කෙටිකාලීන ඉල්ලුම් ගතිකයන් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට අදහස් කරන ලදි. මෙහිදී රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් අංශවල රැකියා ඉල්ලුම් වාර්තා වූ අතර, එහිදී රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්ෂේත්‍රයන් සඳහා 6% බැගින් ඉල්ලුම් නැඹුරුවක්ද , අර්ධ රාජ්‍ය අංශය 11% ඉල්ලුම් නැඹුරුවක්ද , පෞද්ගලික අංශයේ 77% ඉල්ලුම් නැඹුරුවක් ද වාර්තා විය. වැඩිම ඇබෑර්තු සංඛ්‍යාවක් වාර්තා වන ලද්දේ කොළඹ දිස්ත්‍රික්කයෙනි.එය මුළු ඇබෑර්තු සංඛ්‍යාවෙන් 69% විය. මෙහිදී ප්‍රධාන වශයෙන් රැකියා ඉල්ලුම් නැඹුරුව කොළඹ, ගම්පහ, කළුතර යන බස්නාහිර පළාත කේන්ද්‍ර කොටගෙන පවතින බව නිරීක්ෂණය විය.කෘෂිකර්මාන්තය, කර්මාන්ත හා සේවා අංශ සැලකුවිට වැඩිම ඇබෑර්තු සංඛ්‍යාවක් වාර්තා වන්නේ සේවා අංශයෙනි.එයට අමතරව සෞඛ්‍යය හා සමාජ සත්කාර අංශයන්, හෝටල් හා සංචාරක යන උප අංශයන්හි සැලකිය යුතු ඇබෑර්තු සංඛ්‍යාවක් නිරීක්ෂණය විය.  ස්ත්‍රී හා පුරුෂ කාණ්ඩය සඳහා ඇබෑර්තු පිළිබඳ විමසීමේදී මුළු ඇබෑර්තුවලින් 2% ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා පමණක් විවෘතව පවතින බව නිරීක්ෂණය විය. ඇබෑර්තුවලින් 50% ක් පුරුෂ පාර්ශවය සඳහා විවෘත වී ඇත.ඇබෑර්තු වලින් 14% ප්‍රමාණයක් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය සඳහාම විවෘතව පවතින බව පෙනී යයි. 34% ක් ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳව සඳහන් කර නොතිබිණි.

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
		 ඇබෑර්තු වලින් 20.7% ක් ඉහළ කළමණාකාරීත්ව මට්ටමේ ඇබෑර්තු විය. එසේම 38.1% ක් මධ්‍යම මට්ටමේ වන අතර, 41.2% මූලික මට්ටමේ ඇබෑර්තු වන බව නිරීක්ෂණය වේ. රැකියාවේ ස්වභාවය අනුව දත්ත විශ්ලේශණයේදී 79.2% ක් කාර්යාල රාජකාරී සඳහාද, 20.8% ක් ක්ෂේත්‍ර රාජකාරී සඳහා ඇබෑර්තු වන බව නිරීක්ෂණය වේ. 

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
		 අදාල පුවත්පත් ඇබෑර්තු දැන්වීම් අනුව එක් එක් තනතුර සඳහා අදාල වැටුප් මට්ටම් විශ්ලේෂණයේදී ඇබෑර්තුවලින් 58.8% ක් වැටුප් පිළිබඳව තොරතුරු සඳහන් නොකිරීම මත පැහැදිලි නිගමනයකට එළඹීමට නොහැකි විය.  තනතුරු සඳහා අධ්‍යාපන මට්ටම් විශ්ලේෂණයේදී එම තනතුරු වලින් 71% සඳහා අධ්‍යාපන මට්ටම් සඳහන් කර නොතිබිණ.එසේම තනතුරුවල සේවා පලපුරුද්ද ඉල්ලුම් කිරීම සැලකූ විට 77.25% ක් පලපුරුද්ද පිළිබඳ අවශ්‍යතා සඳහන් කර නොතිබිණ.

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
		

02	මහජන රැකියා සේවය වෙත ආයතන වලින් ලැබුණු ඇබෑර්තු වර්ගීකරණය	දෙපාර්තමේන්තුවේ මහජන රැකියා සේවය පෞද්ගලික ආයතන හා කටයුතු කරයි. මෙහිදී අප ආයතනය සමඟ ලියාපදිංචි වී සිටින පෞද්ගලික ආයතනවලින් ලැබෙන රැකියා ඇබෑර්තු එනම් තනතුරු නාමයන් පිළිබඳව හැදෑරීමක් කරන ලදි.එය අන්තර්ජාතික සම්මත රැකියා වර්ගීකරණය (ISCO) අනුව සකසන ලදි. ඒ අනුව ISCO ප්‍රධාන කාණ්ඩ 9 ක් යටතේ ඇබෑර්තු හඳුනා ගන්නා ලදි. කළමණාකරුවන් (ISCO major group-1) වෘත්තිකයන් (ISCO major group-2) තෘතියික හා ආශ්‍රිත වෘත්තිකයන් (ISCO major group-3) ලිපිකරු හා සහය සේවා (ISCO major group-4) සේවා හා වෙළඳ සේවක (ISCO major group-5) කුසලතා සහිත කෘෂිකර්ම වනවගා හා ධීවර සේවකයන් (ISCO major group-6) හස්ත කර්මාන්ත හා ආශ්‍රිත සේවකයන් (ISCO major group-7) යන්ත්‍ර ක්‍රියාකරුවන් හා සවිකරන්නන් (ISCO major group-8) මූලික වෘත්තිකයන් (ISCO major group-9)
03	සේවායෝජක සමීක්ෂණය - මාතර දිස්ත්‍රික්කය / කුරුණෑගල දිස්ත්‍රික්කය / හම්බන්තොට දිස්ත්‍රික්කය / යාපනය දිස්ත්‍රික්කය	රැකියා වෙළඳපොල තුල ප්‍රධාන අංශ 2 ක් පවතී . එනම් ඉල්ලුම් අංශය හා සැපයුම් අංශයයි. සැපයුම් අංශය මගින් රැකියා අපේක්ෂිතයන් නිරූපණය වේ. ඉල්ලුම් අංශය මගින් සේවායෝජකයන් නිරූපණය වේ. මෙම සමීක්ෂණය තුලදී අදාල දිස්ත්‍රික්කයේ ශ්‍රම ඉල්ලුමට පාදක වන සේවායෝජක ආයතනයන්, ඔවුන් පිලිබඳව මූලික තොරතුරු හා නැමියාවන් පිලිබඳවත්, ශ්‍රම වෙළඳපොල තොරතුරු පිළිබඳවත් අධ්‍යයනය කරන ලදි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වනුයේ සේවායෝජක ආයතනත්, රැකියා සේවා මධ්‍යස්ථානයත් අතර සබඳතාවය වඩාත් තහවුරු

		කිරීමය. 2025 වසරේදී මාතර, කුරුණෑගල, හම්බන්තොට හා යාපනය යන දිස්ත්‍රික්කවල මෙම සමීක්ෂණයන් සිදු කරන ලදි. මෙම සමීක්ෂණයට භාජනය වන ආයතනවලින් 80% වැඩි ප්‍රමාණයක් එක් එක් දිස්ත්‍රික්කයේ රැකියා සේවා මධ්‍යස්ථානය සමඟ ලියාපදිංචි වී නොතිබිණ. මාතර, කුරුණෑගල හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල අදාල ආයතනවලින් 80% ක් දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචි වීමට කැමැත්ත දක්වා ඇත. නමුත් යාපනය දිස්ත්‍රික්කයේ 52 % පමණ ලියාපදිංචි වීමට කැමැත්ත පල කර ඇත. සමීක්ෂණයට භාජනය වූ සේවායෝජක ආයතනවලින් 50% වැඩි සංඛ්‍යාවක් සේවා අංශය නියෝජනය කරන අතර, අවමය සේවා අංශය හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් නිරූපණය වේ. මෙහිදී ව්‍යාපාර පරිමාණයන් පිළිබඳවද අධ්‍යයනය කරන ලදි. 60% වැඩි ප්‍රමාණයක් කුඩා පරිමාණ සේවායෝජක ආයතන නිරූපණය වන අතර, එය දේශීය ආර්ථිකයේ ව්‍යුහය නිරූපණය කරයි. කුඩා පරිමාණ ආයතන විශාල සංඛ්‍යාවකගේ පැවැත්ම තුල අවිධිමත් අංශයේ දායකත්වය ඉහළ මට්ටමක පවතී.මෙම ආයතන සඳහා දෙපාර්තමේන්තු මැදිහත්වීම අවශ්‍ය බව නිරීක්ෂණය වේ. කුරුණෑගල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක සැලකුවිට ආයතනගත සේවක සංඛ්‍යාවේ ස්ත්‍රී පාර්ශවය පුරුෂ පාර්ශවයට සාපේක්ෂව ඉහළ අගයක් ගනී. යාපනය හා මාතර දිස්ත්‍රික්කයන්හි ආයතනගත සේවක සංඛ්‍යාව පුරුෂ සේවක සංඛ්‍යාව ස්ත්‍රී සේවක සංඛ්‍යාවට සාපේක්ෂව ඉහල අගයක් ගනී. යාපනය ,කුරුණෑගල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ආයතනගත සේවක සංඛ්‍යා මට්ටම් සැලකුවිට කුසලතා සහිත සේවකයන් ඉහල අගයක් ගනී. මෙහිදී ආබාධ සහිත වූවන් සඳහා රැකියා ලබාදීමේ හැකියාව ආයතනවලින් විමසන ලදි. 70% වැඩි සංඛ්‍යාවක් ආයතන ආබාධිතයන් සඳහා රැකියා ලබාදීම පිළිබඳව සෘණාත්මක පිළිතුරු ලබා දී ඇත. සේවකයන් ආයතනවලින් රැකියා හැරයාම පිළිබඳව එම ආයතන විසින් අධ්‍යයනය කලයුතු බවත්, ඒ සඳහා හේතු මොනවාද යන්න සොයා බලා පිලියම් යෙදීම කල යුතු බවත් නිරීක්ෂණය වේ.
04	රැකියා සොයන්නන් සාත්තු සේවයට ඇති කැමැත්ත සම්බන්ධ ප්‍රශ්නාවලිය	මෙම සමීක්ෂණය සඳහා දෙපාර්තුමේන්තුවේ 2025 මැයි මස 15 දින දක්වා ලියාපදිංචි වී සිටි රැකියා අපේක්ෂිතයින් 25,162 සංගහණයෙන් 10% ක් එනම් 2516 ක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදි. එම නියැදිය සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම දිස්ත්‍රික්ක වලින් ලියාපදිංචියට අදාලව රැකියා අපේක්ෂිතයන් තෝරාගන්නා ලදී.මෙම සමීක්ෂණය සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයෙන් උපදේශනය ලැබුණ අතර එය මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයත් අතර සහයෝගී අධ්‍යයනයක් ලෙස සිදු කරන ලදී. රැකියා අපේක්ෂිතයින්ගේ වයස් කාණ්ඩ,ස්ත්‍රී පුරුෂ භාවය,අධ්‍යාපන මට්ටම් ,කැමැත්ත දක්වා ඇති සාත්තු සේවා ක්ෂේත්‍රයන්,පුද්ගලයින්ගේ ආකල්ප ,විදේශ රැකියා සඳහා ඇති නැඹුරුව ,පුහුණු අවශ්‍යතා හා පුහුණු කාලය,පුහුණු ආයතන හා ප්‍රදේශයන් ,පිරිවැය දැරීම සහ බාධක හා

		අවශ්‍යතා පිළිබඳ මෙහිදී අවධානය යොමු කරන ලදී. මෙම සමීක්ෂණයෙන් අනාවරණය වූ කරුණු පහත පරිදි සාරාංශගත කර දැක්විය හැකිය . 2025 වර්ෂයේ රැකියා අපේක්ෂිතයන්ගෙන් බහුතරයක් දෙනා සුදුසුකම් සහිත හා රැකියා යෝග්‍යතාවය සහිතවූවන් බව නිරීක්ෂණය කර ඇත. මේ සඳහා වැඩි දියුණු වූ රැකියා ගැලපුම් ක්‍රමවේද, පැතිරුණු වෘත්තීය මාර්ගෝපදේශ සේවා හා වෘත්තීය උපදේශන සේවා පුහුණුව, පාඨමාලා වරණයන් පිලිබඳව ඉහළ තොරතුරු සම්පාදන සේවා , ව්‍යවසායකත්වය පිලිබඳ හා කුසලතා වර්ධනය බලගන්වන වැඩසටහන් සමගාමීව අවශ්‍ය බව දක්වා ඇත. ශ්‍රී ලංකාවේ රැකියා ඵලයන් හා ශ්‍රමබලකාය උපයෝගී කර ගැනීම සඳහා මැදිහත්වීමට පුළුල් සම්බන්ධීකරණයකින් යුතු ශ්‍රම වෙළඳපොල ප්‍රතිපත්තීන් හා දිස්ත්‍රික් මට්ටමේ මැදිහත්වීම අවශ්‍ය බව දක්වා ඇත. මෙම සමීක්ෂණයේ හඳුනාගත් කරුණ ලෙස ප්‍රධාන වශයෙන් මධ්‍යම මට්ටමේ අධ්‍යාපනය ලද තරුණ ප්‍රජාව නියෝජනය වන බව පෙනී යයි. එසේම පුළුල් කාන්තා සහභාගීත්වයක් පවතින බව නිරීක්ෂණය කර ඇත. මෙම සමීක්ෂණයේ අනාවරණයන් මගින් තරුණ ප්‍රජාව කේන්ද්‍ර කරගත් අධ්‍යාපන, පුහුණු හා වෘත්තීය සංවර්ධනය අවශ්‍ය වන බව ප්‍රකට වේ . රැකියා යෝග්‍යතාවය හා ප්‍රායෝගික කුසලතා සඳහා වන වෘත්තීය මට්ටමේ සහතික පත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා සහ කෙටිකාලීන පුහුණු වැඩසටහන් පුළුල් කිරීමේ අවශ්‍යතාවය මෙම අධ්‍යයනය මගින් යෝජනා කර ඇත. මෙම නියැදිය තුල ඉහළ කාන්තා සහභාගීත්වයක් පැවතීම හේතුකොට ගෙන මෙම දත්ත පදනම් කරගෙන සිදු කරන අධ්‍යාපන, පුහුණු හා වෘත්තීය වැඩසටහන් හා සේවා වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළබඳව සංවේදී ප්‍රතිපත්ති වැඩසටහන් හා සේවා සැලසුම් කල යුතු බව නිරීක්ෂණය කර ඇති අතර ප්‍රධාන වශයෙන් ශාස්ත්‍රීය හා වෘත්තීය අධ්‍යාපන හා සේවා ලබාදීමේදී ඒ පිළිබඳව සලකා බැලිය යුතු බව සඳහන් වේ.

2.3.2 වෘත්තීය මාර්ගෝපදේශ අංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
01	උසස්පෙළ සිසුන් සඳහා වැඩලෝකයට නිපුණත්වයෙන් යුතුව පිවිසීම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමේ වැඩසටහන (A/L Tech Visit)	පාසැල් අධ්‍යාපනය ලබන කාලය තුළදී නිපුණත්වයක් සහිතව වැඩ ලෝකයට සම්බන්ධ වීමේ වැදගත්කම අවබෝධ කරවීම හා පාසැල් අධ්‍යාපනයෙන් පසු වෘත්තීය පාඨමාලාවක් තෝරා ගැනීමට සිසුන්ට පෙළඹවීමක් ඇති කර වීම මේ තුළින් සිදු වන අතර, ලංකාවේ දිස්ත්‍රික්ක 24 ක වැඩසටහන් 53 ක් ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා සහභාගී වූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 4,201 කි. මෙම වැඩසටහන සඳහා වැය වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.2,334,525/-කි.

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
02	09 වසර සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන	පාසල් 2,085 ක වැඩසටහන් පවත්වා ඇති අතර සිසුන් 69,624 ක් සඳහා සේවය සපයා ඇත.
03	අ.පො.ස. සාමාන්‍ය පෙළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන	පාසල් 2,518 ක වැඩසටහන් පවත්වා ඇති අතර සිසුන් 75,685 ක් සඳහා සේවය සපයා ඇත.
04	අ.පො.ස. උසස් පෙළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන	පාසල් 1,199 ක වැඩසටහන් පවත්වා ඇති අතර සිසුන් 37,900 ක් සඳහා සේවය සපයා ඇත.
05	අවිධිමත් අංශයේ ශ්‍රමිකයින් හට පෙර හැදුනුම් ඉගෙනුම් ක්‍රමය (RPL) හරහා NVQ සහතික ලබා දීම	දැනට අවිධිමත් අංශයේ සේවයේ නිරත ශ්‍රමිකයින් අතරින් අත්දැකීම් සහිත නමුත්, විධිමත් වෘත්තීය පුහුණු සහතික නොමැති පුද්ගලයින් හට පෙර හැදුනුම් ඉගෙනුම් ක්‍රමය (RPL) හරහා NVQ සහතික ලබා දීම සඳහා දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක් ආවරණය වන පරිදි සමීක්ෂණ වැඩසටහන් පවත්වන ලදී. එහිදී NVQ සහතික නොමැති වෘත්තීන් 05ක් පිළිබඳ තොරතුරු රැස්කර ඇත. එම සමීක්ෂණ තුළින් ප්‍රතිලාභීන් 1,994 දෙනෙකු ලියාපදිංචි වී ඇත. ඒ අතරින් අනුරාධපුර හා යාපනය යන දිස්ත්‍රික්ක වලින් ශ්‍රමිකයන් 150 දෙනෙකු සඳහා RPLක්‍රමවේදය හරහා NVQ සහතික නොමිලේ ලබා දීමට මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇත.
06	දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුව	දැනට ශ්‍රම වෙළඳපොළ පවතින තත්වය හා අනාගත ශ්‍රම වෙළඳපොළ පිළිබඳව දැනුම යාවත්කාලීන කිරීමට පෞද්ගලික අංශය සමඟ එක්ව නිලධාරී පුහුණු වැඩමුළු 13 ක් පවත්වා ඇත. නිලධාරීන් 689 ක් සහභාගී වී ඇත. වැය වූ ප්‍රතිපාදන රු.2,544,407/-
07	රැකියාවක, අධ්‍යාපන කටයුත්තක හෝ පුහුණුවක නිරත නොවන කණ්ඩායම (NEET) ඇතුළු අවධානම් සහගත තරුණ ප්‍රජාව පිළිබඳ සමීක්ෂණය හා ඔවුන් සක්‍රීය ශ්‍රම වෙළඳපොළ වෙත දායක කර ගැනීමේ වැඩසටහන	ශ්‍රී ලංකාවේ රැකියාවක, අධ්‍යාපන කටයුත්තක හෝ පුහුණුවක නිරත නොවන කණ්ඩායම (NEET)ඇතුළු අවධානම් සහගත තරුණ ජනගහනය හඳුනා ගැනීම හා ඔවුන් එසේ වීමට හේතු හඳුනා ගැනීම හා සේවා නියුක්තිය සඳහා වන පුහුණු සඳහා යොමු කිරීම අරමුණු කර ගනිමින් දීප ව්‍යාප්ත සමීක්ෂණයක් හා ඉන් අනතුරුව ඔවුන් සක්‍රීය ශ්‍රම වෙළඳපොළ වෙත දායක කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. සමීක්ෂණය තුළින් ප්‍රතිලාභීන් 3,144 හඳුනාගෙන ඇත.

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
08	රැකියා විරහිත තරුණ තරුණියන් බල ගැන්වීමේ වැඩසටහන (Empower Youth)	අවුරුදු 25 ට අඩු තරුණ තරුණියන් ඉලක්ක කරගත් ධාරිතා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා ඒ තුළින් තරුණ තරුණියන්ගේ ශ්‍රම සහභාගිත්වය හා නිපුණතාවය ඉහල නැංවීමත් ගුණාත්මක ශ්‍රම බලකායක් ලෙස තරුණ ප්‍රජාව බල ගැන්වීමේ අභියෝගය සාක්ෂාත් කර ගැනීමේ වැඩසහන. දිවයින පුරා වැඩසටහන් 62 ක් ක්‍රියාත්මක කර ඇත. ප්‍රතිලාභීන් 2,358 ක් සහභාගී වී ඇත. එම වැඩසටහන සඳහා වැය වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.1,956,850/- කි.
09.	ශ්‍රම වෙළඳපොලට ගැලපෙන ආකාරයට උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අවශ්‍යතා හඳුනා ගැනීමට අ.පොෂ. උසස්පෙළ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන (Workforce Sri Lanka)	දිවයින පුරා වැඩසටහන් 162 ක් සිදු කල අතර ඒ සඳහා අ.පොෂ. උසස් පෙළ සිසුන් 19,990 දෙනෙකු සහභාගි වී ඇත.

2.3.2.1. 2025 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව සිදු කරන ලද වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සඳහා ගණනය කළ මූල්‍යමය වටිනාකම් පැවරීම

අනු අංකය	වැඩසටහන	මූල්‍ය ප්‍රතිපාදන යටතේ වැඩසටහන සිදුකලේ නම් එක් ප්‍රතිලාභියෙකු සඳහා වියදම (A)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (B)	ගණනය කළ මූල්‍යමය අගය (A)* (B)
01	09 වසර සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන.	රු.150/-	69,624	10,443,600/-
02	අ.පොෂ. සාමාන්‍ය පෙළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන.	රු.150/-	75,685	11,352,750/-
03	අ.පොෂ. උසස් පෙළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන.	රු.150/-	37,900	5,685,000/-
04	වෘත්තීන් 05 කට අඳාල සේවයේ නිරත NVQ සහතිකපත් නොමැති අයවළුන් සඳහා නොමිලේ සහතිකපත් ලබා දීම සඳහා දිස්ත්‍රික්ක 11 ක් ආවරණය වන පරිදි සමීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හා එමගින් සේවයේ නියුතු ශ්‍රමිකයින් 1994 දෙනෙකු NVQ සහතික ලබා දීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට සම්බන්ධ කිරීම.	රු.100/-	1,994	199,400/-

අනු අංකය	වැඩසටහන	මූල්‍ය ප්‍රතිපාදන යටතේ වැඩසටහන සිදුකලේ නම් එක් ප්‍රතිලාභියෙකු සඳහා වියදම (A)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (B)	ගණනය කළ මූල්‍යමය අගය (A)* (B)
05.	RPL ක්‍රමවේදය හරහා NVQ සහතික නොමිලේ ලබා දීම සඳහා විදුලි කාර්මික ශිල්පීන් 150 මහජන උපයෝගිතා කොමිශන් සභාව වෙත යොමු කිරීම.	(එක් පුද්ගලයෙක් වෙනුවෙන් අවම දළ වියදම) රු.11000/-	150	1,650,000
06.	පුහුණුවක, රැකියාවක හෝ අධ්‍යාපනයක නිරත නොවන කණ්ඩායම්, අවධානම් කණ්ඩායම් සඳහා සමීක්ෂණ වැඩසටහන.	රු.100/-	3,144	314,400/-
07.	මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ සංකල්ප පත්‍රිකාව ඉදිරිපත් කිරීම.			
08.	AI තාක්ෂණය වැනි නව තාක්ෂණ ක්‍රමවේද වලට සිසුන් සුදානම් කළයුතු ආකාරය පිළිබඳ ක්ෂේත්‍රෙය් විශේෂඥයකු මඟින් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	රු.500/-	70	30,000+35,000 = 65,000/-
09.	ක්ෂණික ආහාර හා ක්ෂණික අවන්හලක් පවත්වාගෙන යාම පිළිබඳ පුහුණු පාඨමාලාව (QSR) මෙහිදි මාස 04 ක න්‍යායික පූහුණුවකින් පසුව වැටුප් සමඟ මාස 06ක On the Job training ලබා දෙන අතර මාස 10 ක් අවසානයේ NVQ 4 සහතිකය ලබා දෙන ලදි. මෙම වැඩසටහන සඳහා අ.පො.ස. සා.පෙළ දක්වා උගත් පිරිස වෙනුවෙන් VTA, Gamma Pitzzakraft lanka pvt ltd හා කාර්මික අධ්‍යාපන හා පූහුණු කිරීමේ (DTET)දෙපාර්තමේන්තුව එක්ව සිදු කරණ ලද වැඩසටහන.	රු.150/-	440	66,000/-
10.	ශ්‍රම වෙළඳපොලට ගැලපෙන ආකාරයට උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අවශ්‍යතා හඳුනා ගැනීමට අ.පො.ස. උසස්පෙළ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන (Workforce Sri Lanka)	රු.150/-	19,990	2,998,500/-

අනු අංකය	වැඩසටහන	මූල්‍ය ප්‍රතිපාදන යටතේ වැඩසටහන සිදුකලේ නම් එක් ප්‍රතිලාභියෙකු සඳහා වියදම (A)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (B)	ගණනය කළ මූල්‍යමය අගය (A)* (B)
11.	පෞද්ගලික අංශය සමඟ එක්ව 2025 අ.පො.ස. උසස් පෙළ ගණිත අංශයට මුහුණ දුන් සිසුන් සඳහා අනාගත ලෝකය ජය ගැනීම සඳහා පැවැත් වූ වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන	රු.100/-	100	10,000+10000 =20,000/-
12.	ලංකා බැංකුව එක්ව අ.පො.ස.උ.පෙළ හා අ.පො.ස. සා.පෙළ සිසුන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන ණැනජය වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යාපණික වැඩසටහන.	රු.150/-	6,000	900,000/-
මූළු එකතුව				**33,694,650/-**

2.3.3 මානව සම්පත් කළමනාකරණ අංශය

අනු අංකය	**වැඩසටහන**	**ප්‍රගතිය**
09.	විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් දැනුවත් කිරීම	වයස අවු.18 -30 ත් අතර විශේෂ අවශ්‍යතා සහිත අයවලුන් රැකියාගත කිරීම හා රැකියාවේ නියුක්ත වීම හා රැකියාවක නියුක්ත වීමෙන් ඇති ආර්ථිකමය හා සමාජීය වැදගත්කම තහවුරු කිරීම උදෙසා ආකල්ප සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් (PWDS) අතරින් දිස්ත්‍රික්ක 24 ක් ආවරණය වන පරිදි විශේෂ අවශ්‍යතා සහිත අයවලුන් 337 දෙනෙකු රැකියාගත කර ඇත.
10.	තොරතුරු තාක්ෂණ ඒකකය	01.දෙපාර්තමේන්තු වෙබ් අඩවියට අදාල යාවත්කාලීන කටයුතු සිදු කිරීම සහ Procons ආයතනය (Developer) සහ ICTA ආයතනය සමඟ නව මුහුණුවරකින් යාවත්කාලීන කිරීම. 02. ඩිජිටල් ව්‍යවසායකත්ව (Digital Entrepreneurship) වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම. වැඩසටහන් 59 ක් ක්‍රියාත්මක කර ඇත. සහභාගි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2260 කි. වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය 4,475,000/- ඉන් එම වැඩසටහන සඳහා වැය වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 4,196,824/- කි. 03. දෙපාර්තමේන්තුව සතුව පවතින සමාජ මාධ්‍ය ජාලා හා (FB, YouTube, Twitter, linkedin, TikTok) යවාත්කාලීන කිරීම.

❖ උසස් පෙළ සිසුන් සඳහා වැඩලෝකයට නිපුණත්වයෙන් යුතුව පිවිසීම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමේ වැඩසටහන (ගම්පහ සහ රත්නපුර පැවති වැඩසටහන්)





❖ රැකියා විරහිත තරුණ තරුණියන් බල ගැන්වීමේ වැඩසටහන (Empower Youth) - කෑගල්ල, අරණායක පැවති වැඩසටහන.





❖ වයස අවු.18 -30 ත් අතර විශේෂ අවශ්‍යතා සහිත අයවලුන් රැකියාගත කිරීම හා රැකියාවේ නියුක්ත වීම හා රැකියාවක නියුක්ත වීමෙන් ඇති ආර්ථිකමය හා සමාජීය වැදගත්කම තහවුරු කිරීම උදෙසා
ආකල්ප සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන (PWDS) - රැකියාගත වූ අයවලුන්





❖ ඩිජිටල් අලෙවිකරණ පුහුණු ලබා දීම - කුරුණෑගල





❖ RPL ක්‍රම වේදය හරහා NVQ සහතික ලබා දීමේ වැඩසටහන අනුරාධපුර, යාපනය දිස්ත්‍රික්ක







2.3.4 මහජන රැකියා සේවා අංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය
01	ව්‍යාපෘතීය පොළ /රැකියා පොළ වැඩසටහන්	දිස්ත්‍රික් ව්‍යාපෘතීයපොළ/රැකියා පොළ වැඩසටහන් 26 ක් සහ ප්‍රාදේශීය ව්‍යාපෘතීය පොළ/රැකියා පොළ වැඩසටහන් 226 ක් සංවිධානය කොට පවත්වන ලදී.
02	මාර්ගගත ක්‍රමයට දිස්ත්‍රික් මට්ටමින් Google පෝරමය හරහා රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කර ගැනීම.	දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් පැමිණෙන සියලු රැකියා අපේක්ෂිතයින්ගේ තොරතුරු 2025 වර්ෂයේ සිට එක් දත්ත පද්ධතියක් ලෙස රැස්කර ගැනීමට හැකියාව ඇතිවිය. ඒ අනුව රැකියා අපේක්ෂිතයින් 69,984 ප්‍රමාණයක් ලියාපදිංචි කර ගැනීමට හැකි වූ අතර, එසේ ලියාපදංචි වූ සියලු රැකියා අපේක්ෂිතයින්ගේ අපේක්ෂාවන් පහත අකාරයට හඳුනාගැනීමට කටයුතු කරන ලදී. ඉන්පසු ඔවුන් වෙනුවෙන් ඉදිරි වැඩසටහන් සැලසුම් කර පැවැත්වීමට කටයුතු කළ අතර, දිස්ත්‍රික් මෙන්ම ප්‍රාදේශීය මට්ටමින්ද ලියාපදිංචි වූ සියලු රැකියා අපේක්ෂිතයින් සඳහා ගනුලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වෙන් වෙන්ව මාසිකව ප්‍රගතිය ලබාගැනීමට කටයුතු කරන ලදී. 1) ව්‍යාපෘතීය ගමන් මඟ පිළිබඳව අදහසක් මෙන්ම ඊට අවශ්‍ය සුදුසුකම් ද සහිතව සෘජුවම රැකියාවක් අපේක්ෂා කරන පිරිස 2) ව්‍යාපෘතීය ගමන්මඟ පිළිබඳව කිසිදු අදහසක් නොමැති පිරිස 3) ව්‍යාවසායකයෙකු ලෙස සංවර්ධනය වීමට කැමත්තක් දක්වන හා ඊට අවශ්‍ය පුහුණු අපේක්ෂා කරන පිරිස. 4) ව්‍යාපෘතීය ගමන්මඟ පිළිබඳ අදහසක් ඇති නමුත් සුදුසු පාඨමාලාවන් පිළිබඳව අවබෝධයක් නොමැතිව ඒ පිළිබඳ මාර්ගෝපදේශය බලාපොරොත්තු වන පිරිස.
03	ආයතන ලියාපදිංචිය	රැකියා සපයන ආයතන ලියාපදිංචි කරගැනීම සඳහා ද Google පෝරමයක් හඳුන්වාදුන් අතර, ඒ අනුව 2025 වර්ෂයේ රැකියා සපයන ආයතන 404ක් ලියාපදිංචි විය. එසේ ලියාපදිංචි වූ රැකියා සපයන ආයතවල රැකියා පුරප්පාඩු ලබාගැනීමට කටයුතු කරන අතර, ඒවා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.dme.lk මගින් සහ රැකියා අපේක්ෂතයින් ලියාපදිංචි වී ඇති Whatapp සමූහය හරහා දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.
04	රැකියා සඳහා යොමු කිරීම	පුද්ගලික ආයතනවල පුරප්පාඩු සඳහා රැකියා අපේක්ෂිතයින් 19,824 ක් යොමු කිරීමට කටයුතු කළ අතර, එයින් 6,310 ක් රැකියාගත කිරීමට කටයුතු කරන ලදී.

05	සති අන්ත පුවත්පත්වල පවතින රැකියා පුරප්පාඩු පිළිබඳව රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම	ප්‍රධාන කාර්යාලයේ මහජන රැකියා සේවා අංශය විසින් සති අන්ත පුවත්පත් වන සිළුමිණ, ලංකාදීප, Sunday Observer, වීරකේසරී (දමිළ), සහ තිනකරන් යන පුවත්පත් මිළදී ගෙන එම පුවත්පත්වල පළවන රැකියා ඇබෑර්තු දිස්ත්‍රික්ක මට්ටමින් පවතින දෙපාර්තමේන්තු Whatsapp සමූහය සහ රැකියා අපේක්ෂිත සමූහය වෙත යොමුකර, පවතින රැකියා පුරප්පාඩු පිළිබඳව රැකියා අපේක්ෂිතයින් දැනුවත් කරනු ලබයි. ඒ අනුව 2025 වර්ෂයේ ඉහත සඳහන් සිංහල පුවත්පත්වල පළ වූ රැකියා ඇබෑර්තු 4,145 සම්බන්ධයෙන්ද දෙමළ පුවත්පත්වල පළ වූ ඇබෑර්තු 1,495 සම්බන්දයෙන්ද රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

2.3.4.1. පුද්ගලික ආයතන සමඟ සම්බන්ධීකරණ පුළුල් කරගැනීම සඳහා සේවායෝජක සමුළු පැවැත්වීම

දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික්/ ප්‍රාදේශීය රැකියාපොළ වැඩසටහන් හා රැකියා අපේක්ෂිතයින් පුද්ගලික අංශයේ රැකියා සඳහා යොමුකිරීම සඳහා පුද්ගලික ආයතන සමඟ මනා සබඳතාවයකින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ. එම සම්බන්ධීකරණය පුළුල් කරගනිමින් 2026 වර්ෂයේ ඉලක්කගත වැඩසටහන් සඳහා පුද්ගලික ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන්/ මානව සම්පත් නිලධාරීන්ගේ සහය ලබාගැනීමේ අපේක්ෂාවෙන් ඔවුන් සහභාගී කරවාගෙන සේවායෝජක සමුළු පැවැත්වීමට කටයුතු කෙරිණි. ඒ අනුව 2025 වර්ෂයේ සේවායෝජක සමුළු 03ක් පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙම සේවායෝජක සමුළු මගින් රැකියා වෙළඳපළ තුළ පවතින කාලීන ගැටලු, ඒ සඳහා ලබාදිය හැකි පිළියම් පිළිබඳව පුළුල්ව සාකච්ඡා කිරීමට අවස්ථාව සැකසී ඇත.

	පැවැත්වූ දිස්ත්‍රික්ක	පැවැත්වූ ස්ථානය	පැවැත්වූ දිනය	සහභාගී වූ ආයතන සංඛ්‍යාව	සහභගී වූ විධායක/මානව සම්පත් නිලධාරීන් ගණන
01.	කොළඹ	ප්‍රධාන කාර්යාලය	2025/11/06	34	55
02.	කුරුණෑගල	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	2025/12/15	57	65
03.	ගම්පහ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	2025/12/19	63	75

❖ කුරුණෑගල දිස්ත්‍රික් සේවායෝජක සමුළුව - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය





❖ ගම්පහ දිස්ත්‍රික් සේවායෝජක සමුළුව - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය





2.3.4.2. දිස්ත්‍රික් වෘත්තීය පොළ/රැකියා පොළ සහ ප්‍රාදේශීය වෘත්තීය පොළ/රැකියා පොළ ප්‍රගතිය

	වැඩසටහන	වැඩසටහන් ගණන	පුද්ගලික ආයතන සංඛ්‍යාව	පුහුණු ආයතන සංඛ්‍යාව	රැකියා අපේක්ෂිතයින් සංඛ්‍යාව	රැකියා සඳහා යොමුකළ සංඛ්‍යාව	රැකියාගත කිරීමේ සංඛ්‍යාව
01	දිස්ත්‍රික් වෘත්තීය පොළ/ රැකියා පොළ වැඩසටහන්	26	586	244	10,624	7,349	465
02	ප්‍රාදේශීය වෘත්තීය පොළ/ රැකියා පොළ වැඩසටහන්	226	2,472	1,923	25,354	20,763	2,922
	මුළු ගණන	**252**	**3,058**	**2,167**	**35,978**	**28,112**	**3,387**

2.3.5. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන අංශය

2.3.5.1. සුනිසි මෙහෙවර වැඩසටහන්

වැඩසටහනේ ස්වභාවය	වැඩසටහන් සංඛ්‍යාව	සිදු කරන ලද වැඩසටහන
ව්‍යාපාර සංවර්ධන පුහුණු	5	අනුරාධපුර දිස්ත්‍රික්කයේ වීදි සිහිවටන වෙලෙන්දන් හා දේශීය ශිල්පීන්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සුළු පරිමාණයෙන් සංචාරක කර්මාන්තයේ නිරත ව්‍යවසායකයින්, කොළඹ දිස්ත්‍රික්කයේ සුළු පරිමාණ ලෙස වඩු කර්මාන්තයේ (වඩුමඩුවල) යෙදී සිටින්නන්, මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නියලෙන ව්‍යවසායකයන් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මල්වගාකරුවන්, සඳහා ව්‍යාපාර ලියාපදිංචිය, නව ව්‍යාපාරික අවස්ථා සඳහා මඟ පෙන්වීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වේ. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 140කි.
වෘත්තීය සංවර්ධන පුහුණු	8	අනුරාධපුර දිස්ත්‍රික්කයේ දේශීය විදේශීය සංචාරකයින් සඳහා ගෘහස්ත ලෙස ආහාර සපයන්නන්, විසිතුරු හා අත්කම් භාණ්ඩ නිර්මාණකරුවන්, නවාතැන් මධ්‍යස්ථානවල සේවය කරන සේවක සේවිකාවන්(කාමර සේවා සහායක,ගෘහ පාලන සුපරීක්ෂක,

		පිළිගැනීමේ නිලධාරී, ආගන්තුක සබඳතා නියෝජිත, හෝජනාගාර සේවක,බීමහල් සේවා සහායක) , ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇදුම් මැසීමේ නිරතවූවන්, හම්බන්තොට හා රත්නපුර දිස්ත්‍රික්කවල සංචාරකයින් සඳහා නවාතැන් හා සේවා පහසුකම් (Homestay) සැපයීයම් නිරතවූවන්, කළුතර දිස්ත්‍රික්කයේ නිමි ඇදුම් බෑග් මසන කාන්තාවන්, කෑගල්ල දිස්ත්‍රික්කයේ කිතුල් කර්මාන්තයේ නිරත වූවන් සඳහා වෘත්තීය ගමන්මග සාර්ථක කර ගැනීම සඳහා මග පෙන්වීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් වේ. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 316කි.
NVQ සුදුසුකම හෝ පිළිගත් සහතිකයක් ලබා ගැනීම පිළිබඳ මග පෙන්වීම	3	නුවරඑළිය දිස්ත්‍රික්කයේ හෝම්ස්ටේ (Homestay) කර්මාන්තයේ නිරත ව්‍යවසායකයින්, පුත්තලම දිස්ත්‍රික්කයේ සංචාරක බෝට්ටු රයිඩර්වරුන් සඳහා RPL හරහා NVQ ලබා ගන්නා ආකාරය පිළිබඳ දැනුවත් කිරීම හා ඒ සඳහා යොමු කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වේ. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 88කි.
මුළු එකතුව	16	මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 544 කි.

2.3.5.2. අවිධිමත් අංශයේ වැඩසටහන්

වැඩසටහනේ ස්වභාවය	වැඩසටහන් සංඛ්‍යාව	සිදු කරන ලද වැඩසටහන
ව්‍යාපාර සංවර්ධන පුහුණු	23	යාපනය දිස්ත්‍රික්කයේ තල් ආශ්‍රිත අත්කම් නිෂ්පාදනයේ නිරත ව්‍යවසායකයින්, මඩකලපුව දිස්ත්‍රික්කයේ හැන්ඩ්ලූම් නිෂ්පාදකයින්, මැටි ආශ්‍රිත නිෂ්පාදන සිදුකරන්නන්, පාවහන් නිෂ්පාදනයේ නිරත ව්‍යවසායකයින්, තල් ආශ්‍රිත අත්කම් නිෂ්පාදනයේ නිරත ව්‍යවසායකයින්, අම්පාර දිස්ත්‍රික්කයේ හාල් පිටි නිෂ්පාදකයින්, වව්නියා දිස්ත්‍රික්කයේ තල් ආශ්‍රිත අත්කම් නිෂ්පාදනයේ නිරත ව්‍යවසායකයින්, කළුතර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ගෘහස්ථ මට්ටමින් කාන්තා හා ළමා ඇදුම් නිර්මාණයෙහි නිරතවූවන්, මොණරාගල, මාතලේ, ත්‍රිකුණාමලය, වව්නියා හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල සුළුපරිමාණ ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාර උපදේශනය,සැලසුම් කිරීම, ව්‍යාපාර ලියාපදිංචිය, ව්‍යාපාර පුළුල් කර ගැනීම හා අත්දැකීම් හුවමාරු කර ගැනීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාර සංවර්ධන පුහුණු වැඩසටහන් වේ. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 710කි.

වෘත්තීය සංවර්ධන පුහුණු	18	යාපනය දිස්ත්‍රික්කයේ සුළු පරිමාණ වශයෙන් ඇදුම් මැසීමේ නිරතවූවන්,අම්පාර දිස්ත්‍රික්කයේ බතික් නිෂ්පාදනය කරන්නන්, සුළු පරිමාණ වශයෙන් අයිසිං කේක් සාදන්නන් , ගම්පහ දිස්ත්‍රික්කයේ අවිධිමත් ලෙස කොණ්ඩා කැපීම් ක්ෂේත්‍රයේ නිරත ස්වයං රැකියාලාභීන් , කිලිනොච්චි දිස්ත්‍රික්කයේ තල් ආශ්‍රිත නිෂ්පාදනයේ නිරත ව්‍යවසායකයින්, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඇදුම් මැසීමේ නිරතවූවන්, මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්කවල බතික් නිෂ්පාදනය කරන්නන්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ පිළිගත් වෘත්තීය පුහුණු සහතිකයක් නොමැති රූපලාවන්‍ය ශිල්පීන්, කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවල සුළු පරිමාණ ලෙදර් බෑග් හා අනෙකුත් බෑග් නිෂ්පාදකයින්, මාතලේ දිස්ත්‍රික්කයේ සම්ප්‍රදායිකව බිම්මල් නිෂ්පාදනයේ යෙදෙන ව්‍යවසායකයින්, කෑගල්ල දිස්ත්‍රික්කයේ කිතුල් කර්මාන්තයේ නිරත වූවන් සඳහා වෘත්තීය ගමන්මග සාර්ථක කර ගැනීම සඳහා මග පෙන්වීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් වේ. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 613කි.
ව්‍යවසායකයන් සවිබල ගැන්වීම	17	කොළඹ, ගම්පහ, මාතලේ, නුවර, ගාල්ල, හම්බන්තොට, කුරුණෑගල, පුත්තලම, කෑගල්ල, අම්පාර දිස්ත්‍රික්කවල සුළුපරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වේ. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 574 කි.
තාක්ෂණික පුහුණු	5	යාපනය දිස්ත්‍රික්කයේ ස්වයං රැකියාවක් ලෙස ඇදුම් මැසීමේ නිරතවූවන් හා ආහාර සැකසීමේ නිරතවූවන්, මාතර දිස්ත්‍රික්කයේ පාවහන් නිෂ්පාදනයේ නිරත කුඩා ව්‍යවසායකයින්, මොණරාගල දිස්ත්‍රික්කයේ ස්වභාවිකව මල්මාලා ගෙතීමේ නියුක්තිව සිටින්නන්, ගාල්ල දිස්ත්‍රික්කයේ ගෘහස්ථ මට්ටමින් කුළුබඩු හා රස කැවිලි ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන්නන් සඳහා නවීන තාක්ෂණ භාවිතාවන් හඳුන්වා දීම, තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වා දීම හා නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුනු කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වේ. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 211 කි.
දේශීය/විදේශීය වෙළඳපොල ක්‍රම හඳුන්වා දීම	5	ගම්පහ දිස්ත්‍රික්කයේ දේශීය වෙළඳපල තුල මල් හා විසිතුරු ශාක පත්‍ර වගාකරුවන්, විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නිරතවන්නන්, වව්නියා දිස්ත්‍රික්කයේ බතික් නිෂ්පාදනය කරන්නන් හා රන් ආභරණ නිෂ්පාදකයින් සඳහා දේශීය/විදේශීය වෙළඳපොල ප්‍රවණතා ,නූතන වෙලඳපල හා අනුගත කිරීම, අලෙවිකරණය ආශ්‍රිත ගැටළු පිළිබඳ දැනුවත් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වේ. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 213 කි.
NVQ සුදුසුකම් හෝ පිළිගත් සහතිකයක් ලබාදීම	7	ගම්පහ දිස්ත්‍රික්කයේ පෙදරේරුවන්, මහනුවර දිස්ත්‍රික්කයේ පෙදරේරුවන් හා රූපලාවන්‍ය ශිල්පීන්, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල රූපලාවන්‍ය ශිල්පීන් සඳහා RPL හරහා NVQ ලබා ගන්නා ආකාරය පිළිබඳ දැනුවත් කිරීම හා ඒ සඳහා යොමු කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වේ. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 283 කි.

මූල්‍ය සාක්ෂරතාවය	6	කොළඹ, ගම්පහ,මාතර හා බදුල්ල දිස්ත්‍රික්කවල සුළුපරිමාණ ව්‍යවසායකයින් සඳහා පිරිවැයකරණය, ගිණුම් තබා ගැනීම, මිල ගණන් සැකසීම, පොත් තැබීම පිළිබඳ දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වේ. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 257 කි.
මුළු එකතුව	81	මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2861 කි.

2.3.5.3. අවිධිමත් ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා සිදු කරන ලද සුනිසි මෙහෙවර හා අවිධිමත් අංශයේ විශේෂ වැඩසටහන්

දිස්තක්කය	ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය	සිදු කරන ලද වැඩසටහන	ප්‍රගතිය
මාතර	කඩවත්සතර	පාවහන් නිෂ්පාදනය කරන කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ තාක්ෂණික දැනුම, නිෂ්පාදන වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම, මුහුණපාන තාක්ෂණික ගැටලු වලට විසඳුම් ලබා දීම හා වෙළඳපළ නව ප්‍රවණතා ප්‍රවර්ධනය හා අලෙවි ප්‍රවර්ධනය අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 21කි.	තාක්ෂණික ගැටලු වලට විසඳුම් ලබා දීම අරමුණු කර ගනිමින් ප්‍රතිලාභීන් 24 දෙනෙකු සඳහා වට්ස්ඇප් සමූහයක් මඟින් නිරන්තරයෙන් තොරතුරු හා සේවා පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරනු ලැබේ. එයින් 8 දෙනෙකු ව්‍යාපාර ලියාපදිංචියට යොමු වී ඇත.
අනුරාධපුරය	මිහින්තලය	වීදි සිහිවටන වෙළඳුන් හා දේශීය ශිල්පීන් හඳුනාගැනීම හා ලියාපදිංචිය, නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, සන්නාමීකරණය හා අලෙවි ප්‍රවර්ධනය පිළිබඳ දැනුවත් කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 30කි.	ප්‍රතිලාභීන් 27 දෙනෙකු සඳහා වට්ස්ඇප් සමූහයක් මඟින් නිරන්තරයෙන් තොරතුරු හා සේවා පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරනු ලැබේ. එයින් 20දෙනෙකු ශිල්ප සභාවේ ලියාපදිංචිය ලබා ගෙන ඇත.
නුවරඑළිය	නුවරඑළිය	ගෘහස්ථ(Homestay) කර්මාන්තයේ නිරත ව්‍යවසායකයින්ට විධිමත් පුහුණුවත් සමඟ NVQ Level 3 සහතිකපත් ලබාගැනීමට යොමු කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 20කි.	මෙම වැඩසටහන NAITA ආයතනය මඟින් NVQ Level 3 සුදුසුකම ලබා දීමේ පාඨමාලාවකි. ප්‍රතිලාභීන් 20 දෙනෙකු NAITA ආයතනයේ සම්පත්දායකත්වයෙන් පවත්වන වැඩසටහනට සහභාගි වී අදාල NVQ3 සුදුසුකම ලබා ගැනීමට යොමු වී ඇත.

පුත්තලම	කල්පිටිය	සංචාරක බෝට්ටු පදවන්නන්ගේ (Boat Riders) කුසලතා සංවර්ධනය හා සාගර විශ්ව විද්‍යාලය මගින් පිළිගත් සහතිකයක් ලබා දීම සඳහා මෙම වැඩසටහන පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 36කි.	36 දෙනෙකු සඳහා සහතිකය සාගර විශ්ව විද්‍යාලය මගින් ලබා දී ඇත. තවද මෙම පිරිස ඇතුලත් කර වට්ස්ඇප් සමූහයක් සකසා ඇත.
කෑගල්ල	යටියන්තොට, බුලත්කොහුපිටිය, දැරණියගල	කිතුල් කර්මාන්තයේ නිරත පිරිසට නව තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරන ආකාරය, නව වෙළඳපොල අවස්ථා හඳුන්වා දීම, අලෙවිකරණය ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීම පිළිබඳ දැනුම ලබා දීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 111කි.	කිතුල් නිෂ්පාදකයින්ගේ සමිතිය නමින් සමිති 3ක් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ 3 නියෝජනය වන පරිදි පිහිටුවා ඇත. එහි බුලත්කොහුපිටිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ යේ සමිතියේ සාමාජිකයින් 41 ක් ද යටියන්තොට ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ යේ සමිතියේ සාමාජිකයින් 32 ක් ද දැරණියගල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ යේ සමිතියේ සාමාජිකයින් 30 ක් ද සිටින අතර මාස 3කට වරක් රැස්වන අතර එමගින් වගාවට සිදුවන හානි පිළිබඳව, නිෂ්පාදන වැඩි කිරීමට රජයෙන් ලබා දෙන සහන ආදිය පිළිබඳව, ප්‍රමිතියෙන් උසස් නිෂ්පාදන සැකසීම පිළිබඳව හා කැස්පර් තාක්ෂණය පිළිඅඳව දැනුවත් කරනු ලැබේ. සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් ලබා දෙන සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප සඳහා මොවුන් දායක කර ගැනීමට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ නිලධාරින් විසින් දැනුවත් කිරීම් කිරීමට ද කටයුතු යොදා ඇත.

❖ පාවහන් නිෂ්පාදනය කරන කුඩා ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ වැඩසටහන - මාතර





❖ ගෘහස්ථ(Homestay) කර්මාන්තයේ නිරත ව්‍යවසායකයින්ට විධිමත් පුහුණුවක් ලබා දීම - නුවර එළිය





❖ වීදි සිහිවටන වෙළෙන්දන් හා දේශීය ශිල්පීන් විධිමත් කිරීම සඳහා වූ වැඩසටහන - අනුරාධපුරය





❖ බෝට්ටු පදවන්නන් සඳහා පුහුණුව - කල්පිටිය





❖ කිතුල් කර්මාන්තයේ නියුක්තිකයන් සඳහා විධිමත් නිපුණත්වය ලබා දීම - කෑගල්ල





2.4. ඉදිරි සැලසුම්

01. කම්කරු ක්ෂේත්‍රය තුළ දළදේශීය නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලබා දීමට හැකිවන පරිදි ඵලදායී ශ්‍රම බලකායක් බිහි කිරීමට සුදුසුවන පරිදි ප්‍රතිපත්ති සැකසීමට ගැලපෙන ලෙස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ප්‍රතිව්‍යුහගත කිරීම.

02. අවම පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශ වල පිහිටි පාසැල් වල ඉගෙනුම ලබන අ.පොෂ.උසස් පෙළ සිසුන් ඉලක්ක කරගනිමින් වැඩලෝකයට නිපුණත්වයෙන් යුතුව පිවිසීම සඳහා ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමට වෘත්තීය පුහුණු ආයතන නිරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (Vocational Training Institute Visit)

03. ආබාධිත පුද්ගලයන් අතරින් රැකියාවක් කිරීමට සුදුසු පුද්ගලයන් හඳුනා ගෙන (සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ ඒකාබද්ධව) ඔවුන්ගෙන් 600 ක පිරිසක් 2026 වර්ෂය තුළ පෞද්ගලික අංශයේ රැකියාගත කිරීමට කටයුතු කිරීම

04. අවිධිමත් අංශයේ තෝරාගත් වෘත්තීන්හි නියැලෙන ශ්‍රමිකයන් වෙත විධිමත් පුහුණු අවස්ථා සලසාදීම හා ඔවුන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම, ඔවුන්ගේ සේවාවන් විධිමත් කිරීමට අවශ්‍ය දැනුම ලබාදීම තුළින් නව රැකියා අවස්ථා ඇති කිරීමටත්, විධිමත් අංශයේ කාන්තා ශ්‍රම සහභාගීත්වය ඉහළ නැංවීමටත් අපේක්ෂා කිරීම.

05. අවිධිමත් අංශයේ ස්වයං රැකියාවක් හෝ ව්‍යාපාරවල නිරත පුද්ගලයන් වෙත විධිමත් ලෙස ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ දැනුම ඉහළ නැංවීම, ඔවුන්ගේ ව්‍යාපාර සඳහා නව තාක්ෂණය යොදා ගැනීම තුළින් ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම (Digital Marketing Program)

06. මහජන රැකියා සේවයේ රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචිය/රැකියා සපයන ආයතන ලියාපදිංචිය රැකියා ඇබෑර්තු ඇතුලත් කිරීම හා පසු විපරම් කටයුතු සඳහා මාර්ගගතව තොරතුරු ඇතුළත් කිරීමට හැකිවන පරිදි සකස් කරමින් පවතින ඩිජිටල් යෙදවුම (Digital Application System) දෙපාර්තමේන්තු කටයුතු සඳහා යොදාගැනීම.


07. සේවා යෝජක සමුළු හරහා ලබාගන්නා ලද අදහස් හා යෝජනා හරහා මේ මට්ටමට රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමට (Mini job fair) පැවැත්වීමත්, වෘත්තීය හා තෘතීය අධ්‍යාපන ආයතන වෙත වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ යෝජනා භාරදීමත් ආයතන වල දැනට පවතින පුරප්පාඩු සම්බන්ධව සේවා යෝජක සමුළු වලට සහභාගී වූ ආයතන සම්බන්ධ කර ගනිමින් සමීක්ෂණ පැවැත්වීම.

08. ශ්‍රී ලංකාව තුළ මේ වන විටත් හඳුනාගෙන ඇති අවධානම් සහගත කණ්ඩායම් වලට අයත් රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටියද, දීර්ඝ කාලයක් පුරාවට රැකියා අවස්ථා සඳහා අවස්ථාව නොලද තරුණ ප්‍රජාව සම්බන්ධයෙන් 2026 ට අදාල සමීක්ෂණය සිදුකර ඔවුන් සක්‍රීය ශ්‍රම බලකායට දායක කර ගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.(මෙමගින් ඉදිරි වසර කීපය තුළ මෙරට ඇතිවීමට නියමිත ශ්‍රම බලකායේ අඩුවීම අවම කිරීමට සැලසුම් කර ඇත.)

09. දිවයිනේ සමස්ථ ද්විතීක රජයේ පාසැල් සංඛ්‍යාවෙන් 40% ක් ආවරණය වන පරිදි 09 ශ්‍රේණිය, අ.පොෂ.ස. සාමාන්‍ය පෙළ/ අ.පොෂ.ස. උසස් පෙළ ඉගෙනුම ලබන සිසුන් සඳහා අනාගත වැඩලෝකයට ගැලපෙන පරිදි වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

10. රැකියා අපේක්ෂිත තරුණයින් සඳහා වැඩ ලෝකය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමට (Exposure to world of the work) ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් පෞද්ගලික ආයතන සමඟ ඒකාබද්ධව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.(Empower Youth Programs)

11. රැකියා සපයන ආයතන වර්ගීකරණය, නව රැකියා ප්‍රවණතා විශ්ලේෂණය, එම ආයතන වල මානව සම්පත්වල තත්වය හා පුරප්පාඩු හඳුනාගැනීම සම්බන්ධයෙන් වූ සමීක්ෂණය ඉතිරි වූ දිස්ත්‍රික්ක 21ම ආවරණය කරමින් සිදුකිරීම.



03

පරිච්ඡේදය

වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.1. 2025.12.31 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	තක්‍ය		
			2025	2024	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	**ඒසිඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		581,791,000	544,794,000	**ඒසිඒ-3**
-	තැන්පතු		1,068,512	1,027,304	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		27,877,723	24,295,647	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**610,737,235**	570,116,951	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**610,737,235**	570,116,951	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		21,565,998	31,743	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		589,171,237	570,085,208	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
534,225,000		5	533,384,889		**ඒසිඒ-2(ii)**
87,975,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	84,514,038	95,410,762	
3,800,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	3,793,277	4,575,612	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	


සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	කත්‍ය		
			2025	2024	
රු.			රු.	රු.	
626,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**621,692,204**	585,925,187	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	1,178,334	726,455	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	5,855,861	7,904,960	**ඒසිඒ-2(ii)**
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
-	හැකියා වර්ධනය	14	3,422,583	3,043,865	
-	වෙනත් මූලධන වියදම්	15	14,587,259	15,415,035	
-	**මුළු මූලධන වියදම් (උ)**		**25,044,037**	27,090,315	
	තැන්පතු ගෙවීම්		860,237	1,313,169	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		30,618,592	27,231,516	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		31,478,829	28,544,685	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		678,215,069	641,560,187	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(89,043,832)	(71,474,979)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(89,043,832)	(71,474,979)	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	19,000	**ඒසිඒ-3**
			(89,043,832)	(71,455,979)	

3.2. 2025.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		කත්‍ය	
	සටහන	2025	2024
	_	රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	142,213,817	151,687,788
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	71,873,470	69,132,600
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	19,000
මුළු වත්කම්		**214,087,287**	**220,839,388**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			71,873,470
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		71,598,370	69,065,775
දේපළ පිරියත හා උපකරණ සංචිතය		142,213,817	151,687,788
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	275,100	66,825
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	19,000
මුළු වගකීම්		**214,087,287**	**220,839,388**

පිටු අංක 01 සිට 29 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 30 සිට 60 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.



3.3. 2025.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	**තත්‍ය**	
	2025	**සංශෝධිත 2024**
	රු.	**රු.**
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		33,182,246
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	55,212,362	-
අග්‍රිම ලැබීම්	581,791,000	544,794,000
අත්තිකාරම් අයකර ගැනීම්	26,529,900	24,099,441
තැන්පතු ලැබීම්	1,068,512	1,027,304
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**664,601,774**	**603,102,991**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	596,160,490	557,660,098
සහනාධාර සහ මාරුකිරීම්	3,793,277	4,575,611
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	1,170,734	
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,870,164	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	21,565,998	12,743
අත්තිකාරම් ගෙවීම්	30,838,840	27,377,767
තැන්පතු ගෙවීම්	860,237	1,313,169
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**656,259,740**	**590,939,388**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**8,342,034**	**12,163,603**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	8,342,034	12,144,603
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**8,342,034**	**12,144,603**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(8,342,034)**	**(12,144,603)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**19,000**

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	තත්‍ය	
	2025	සංශෝධිත 2024
	රු.	රු.
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	(0)	19,000
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	19,000

3.4 වෙන් කරන ලද ප්‍රතිපාදන (පවතීනම්) උපයෝගි කර ගැනිමේ කාර්ය සාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	600,000,000	626,000,000	621,692,204	99
ප්‍රාග්ධන	22,000,000	26,000,000	25,044,037	96

3.5 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

පරිත්‍යාග කළ ආයතනය	පරිත්‍යාගයේ අරමුණ	පරිත්‍යාග මුදල

3.6 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	142,213,817	142,213,817		100
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරිගෙන යනවැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.7 විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LSW/B/MP/SR/01/2025 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 22 දින

ගණන්දීමේ නිලධාරී
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 මැයි 20 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන

සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

(අ) 2023 ඔක්තෝබර් 03 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 2023/02 ප්‍රකාරව හා 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 මාර්ගෝපදේශ ප්‍රකාරව සෑම මූල්‍ය වාර්තාරණ ආයතනයක් විසින්ම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කලයුතු වුවද පිළියෙල කර නිබූ මූල්‍ය ප්‍රකාශන තුල 2025 වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මූදල් වැයකිරීම්වල මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන ලෙස රු.8,342,034 ක් සටහන්ව පැවතියද භාණ්ඩාගාර ගිණුම්කරණ ප්‍රකාශන අංක SA 82 අනුව භාණ්ඩාගාරයට වාර්තාකර නිබූ මූලධන වත්කම් මිලදී ගැනීමේ වටිනාකම රු.4,380,948 ක්ව පැවතීමෙන් වෙනස වූ රු.3,961,086 ක අගය සම්බන්ධව අනාවරණය කර නොනිබුනි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් වත්කම් ලේඛනගත කිරීමේදී හා ඉවත්කිරීමේදී CIGAS පද්ධතිය භාවිතා කළද පද්ධතිය තුල ඇති ශේෂයන් තහවුරු කර ගැනීමට සකසන ලද විධිමත් ලැයිස්තුවක් පිළියෙල කර නිබූ බවට නිරීක්ෂණය නොවීය. තවද 2023 ඔක්තෝබර් 03 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2023/02 හි 1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු පරිගණක උපකරණ වාර්තා කිරීමේදී හඳුනාගත හැකි සංකේත අංකයක් (serial no.) වාර්තා කර නොමැති බැවින් 2025 වර්ෂයේදී අපහරණය කරන ලද රු.7,231,400 ක් වූ පරිගණක උපකරණ අංක කිරීම සිගාස් වැඩසටහන් තුල පැහැදිලිව හඳුනාගත නොහැකි විය.

1.6.2 ලේඛන පොත්පත් පවත්වා නොතිබීම

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2024 ජුනි 21 දිනැති අංක **DMA/1-2024** දරන චක්‍රලේඛයේ පරිශිෂ්ඨ 4 ප්‍රකාරව අවදානම් ලේඛනයක් සකස් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී එවැනි ලේඛනයක් සකස් කර නොනිබුනි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 3.3 ප්‍රකාරව බැඳීම් හා බැරකම්වලට නොඑළඹිය යුතු වුවද රු.29,693 ක බැරකමක් සඳහා 2026 පෙබරවාරි 19 දින ගෙවීම් කර තිබුණ ද මු.රෙ.94 (2) හා 94 (3) යටතේ එළඹෙන ලද බැඳීම් සහ බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4, 4.2 .4 හා 4.2.5 වගන්ති	දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටියදී සේවය හැරගිය නිලධාරිකුගෙන් අයවිය යුතු රු.152,076 ක ණය ශේෂය හා විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.162,375 ක මුදල 2025 දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.
(ආ)	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ අංක DMT/HE/1 පොදු-1 හා 2024 ජූලි 18 දිනැති අංක 07/2024 චක්‍රලේඛ	නීරුබදු නිදහස් කොන්දේසි සහිතව ලියාපදිංචි කර ඇති මෝටර් රථ කොන්දේසි ඉවත් නොකොට විකිණීම සිදුකල නොහැකි බැවින් එම කොන්දේසි ඉවත් කිරීමට අදාල අනුමැතීන් ලබාගැනීමෙන් අනතුරුව අයකර හෝ නොඑසේනම් නව ගැනුම්කරුට ඒ සඳහා ගෙවීමට අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් පසුව විකිණීම සිදුකිරීම කලයුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී විකුණන ලද මෝටර් රථයක බදු වටිනාකම වූ රු.91,843 ක් ගැනුම්කරුට වැයබරක් නොවී දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගත් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයේදී පුහුණු අවස්ථා වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්, ව්‍යාපෘති නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන්ට සීමා වී තිබුණි.

3.3 අවධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව සඳහා ලැප්ටොප් පරිගණක 20 ක් සහ ඩෙස්ක්ටොප් පරිගණක 05 ක් මිලදී ගැනීමට 2025 නොවැම්බර් 04 දින වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ ආයතන 05 කින් මිලගණන් කැඳවා එක් සැපයුම්කරුවෙකු පමණක් මිලගණන් ඉදිරිපත් කිරීම හේතුවෙන් නැවත ආයතන 06 කින් 2025 නොවැම්බර් 12 දින මිල කැඳවීම් කර තිබුණි. පවත්නා වෙළඳපළ මිලගණන් පිළිබඳ නිසි අධ්‍යයනයකින් හා ඇගයීමකින් තොරව මිලදී ගැනීමට සැලසුම් කලද, මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ලැප්ටොප් 13 ක් පමණක් මිලදී ගැනීමට පසුව තීරණය කර තිබුණි. මිලදී ගැනීමට අදාල පිරිවිතර සකස් කිරීමේදී යෙදීමට අවශ්‍ය කාර්යාල පැකේජය සමඟ ලැප්ටොප් ලබාදෙන බවට ලංසුකරුවන් එකඟව පැවතියද, එම පිරිවිතර මත මිලදී නොගෙන තෝරාගත් සැපයුම්කරු වෙනින් නැවත පැකේජය යෙදීමට මිලගණන් ලබාදෙන ලෙස ඉල්ලීම් කර එක් ලැප්ටොප් පරිගණකයක් සඳහා රු.35,000 බැගින් රු.455,000 ක් අමතර ලෙස ගෙවීම් කර තිබුණි. මේ අනුව ප්‍රසම්පාදන කටයුතුද නිසි ලෙස සැලසුම් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිවිශේෂ ගැසට්පත්‍ර අංක 1640/31 අනුව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පිහිටුවීමේ ප්‍රධානතම අරමුණු වන ජාතික මිනිස්බල ප්‍රතිපත්තිය සකස්කර ක්‍රියාත්මක කිරීම වුවද, සමාලෝචිත වර්ෂයේදී සකස්කරන ලද ප්‍රතිපත්ති රාමුව සම්පාදනය කර වසර 10 ක් ඉක්ම ගියද එය නැවත සංශෝධනය කර ක්‍රියාත්මක කර බලගැන්වීමේ කාර්යභාරය ඉටුකර නොතිබුණි.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

දෙපාර්තමේන්තුවේ ශ්‍රම වෙළඳපල තොරතුරු රැස්කිරීම, කළමනාකරණය හා නිරණ ගැනීම සඳහා අත්‍යවශ්‍ය "ශ්‍රම වෙළඳපල තොරතුරු පද්ධතියක්" ස්ථාපනය කිරීමේ කාර්යය ඉටුවී නොතිබුණු අතර, පවත්නා තොරතුරු විධිමත් පද්ධතියක් වෙත යොමුකිරීමේ කාර්යභාරය අවසන්ව නොතිබුණි.

4.1.3 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා කර්තව්‍ය සමාජ මාධ්‍යය ඔස්සේ ප්‍රචලිත කිරීම සඳහා පැවති X ගිණුම හා Tik Tok ගිණුම අක්‍රීය තත්ත්වයේ පැවති අතර, එම ගිණුමෙහි 2024 අගෝස්තු 30 න් පසුව පලකිරීම් සිදුකර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුව සතුව පැවති මෝටර් රථයක් බාහිර පාර්ශවයක් වෙත විකිණීමෙන් අනතුරුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සිදුනිරීමේදී එනෙක් පැවති එන්ජින් අංකය වෙනස්වීම නිසා නැවත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් එන්ජින් අංක වෙනස් ලියාපදිංචියක් ලබාදී තිබුණි. දෙපාර්තමේන්තුව සතු වැන් රථයේද 2024 ඔක්තෝබර් 04 දක්වා පැවති එන්ජින් අංකය 2025 සැප්තැම්බර් 29 දින වෙනත් එන්ජින් අංකයක් ලෙස සංශෝධනය කර ලියාපදිංචිය හා දුම් පරීක්ෂාවන් සිදුකර තිබූ අතර, මෙම අංකයන් වෙනස්වීමේ හේතු කෙරෙහි පරීක්ෂා

කර වාහන සම්බන්ධ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ශක්තිමත් කිරීම හෝ ඒ පිළිබඳ අවධානය යොමුකිරීමක් සිදුකර නොතිබුණි.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2025 අප්‍රේල් 28 දිනැති අංක DMA/01/2025 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ 1.5 (iii) ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකය සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සුදුසු නිලධාරියෙකු යටතේ ස්ථාපිත විය යුතු වුවද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකය එකී අවශ්‍යතාවය සපුරා නොතිබූ අතර, මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.2 පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමේදී ඇමණුම 1 හි 2.2 කැඳවුම්කරුවෙකු නොසිටි අතර සංයුතිය අනුව මාර්ගෝපදේශ සංග්‍රහයේ 05 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශය සඳහා විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්යමණ්ඩල පුහුණුව ලබාදිය යුතු නමුත්, සමාලෝචිත වර්ෂයේදී ක්ෂේත්‍රයට අදාල පුහුණුවීම් පවත්වා නොතිබුණි.

කේ.කේ.එෂ්.ජීවකොඩි,
නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට

04

පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමැවුම		
	100% -90%	**75% - 89%**	**50% - 74%**
රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචිය	√		
රැකියා ඇබෑර්තු ලියාපදිංචිය	√		
රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කිරීම			√
රැකියා අපේක්ෂිතයින් පුහුණුව සඳහා යොමු කිරීම	√		
පාසැල් සිසුන් සඳහා සිදු කරන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ගණන	√		
ස්වයං රැකියා හා ව්‍යවසාය ආරම්භ කිරීම	√		

05

පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

ඉලක්කය /අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% - 74%	75% - 100%
තිරසර සංවර්ධන අරමුණු 4 - පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	ඉලක්කය 4.3. 2030 වන විට සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුලත්ව තාක්ෂණික,වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම	සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 20% කට වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම			√
		උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 20% කට වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම			√
		2025 වසර තුල රැකියා අපේක්ෂිතයන් 50,000 ලියාපදිංචි කිරීම			√
තිරසර සංවර්ධන අරමුණු 8 - සියල්ලන් සඳහාම පෝෂිත,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය , පූර්ණ ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධන කිරීම	ඉලක්කය 8.5 2030 වන විට ආබාධිත පුද්ගලයන් සහ යෞවනයන් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායි හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම	2025 වසර තුල රැකියා ඇබෑර්තු 20,000ක් ලියාපදිංචි කිරීම.			√
		2025 වසර තුල රැකියා අපේක්ෂිතයන් 10,000 ක්		√	

ඉලක්කය /අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% - 74%	75% - 100%
		රැකියාගත කිරීම			
		2025 වසර තුල ව්‍යවසායකයින් හා ස්වයංරැකියා ලාභීන් 1,000 ක් බිහි කිරීම			√
		2025 වසර තුල රැකියා අපේක්ෂිතයන් 30,000 ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සිදු කිරීම			√
		2025 වසර තුල රැකියා අපේක්ෂිතයන් 8,000 ක් පුහුණුව සඳහා යොමු කිරීම			√

06

පරිච්ඡේදය

මානව සම්පත් සංවර්ධනය

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය - 2025.12.31 දිනට

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	20	10	10
තෘතීයික	5	1	4
ද්විතීයික	618	583	35
ප්‍රාථමික	15	12	03

6.2 දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත 2025 වර්ෂයේ ලබාදුන් පුහුණු පිලිබඳ විස්තර

අනු අංකය	වැඩසටහන	දිනය	ප්‍රතිලාභීන් ගණන	වියදම	විස්තරය
01	නිලධාරින්ගේ නිපුණතාවය ඉහළ නැංවීමේ වැඩසටහන (බස්නාහිර පළාත)	2025.02.03	74	10,000.00 81,150.00 16,000.00	2025 ක්‍රියාකාරි සැලැස්මට අනුව රාජකාරි ඉටු කිරීම පිළිබඳව පුහුණුව
02.	නිලධාරින්ගේ නිපුණතාවය ඉහළ නැංවීමේ වැඩසටහන (මධ්‍යම පළාත)	2025.03.06	60	53,620.00 21,115.00 16,000.00	2025 ක්‍රියාකාරි සැලැස්මට අනුව රාජකාරි ඉටු කිරීම පිළිබඳව පුහුණුව
03.	Workforce Sri Lanka වැඩසටහන යටතේ නිලධාරින් පුහුණු කිරීම	2025.07.14 හා 15	52	696,640.00 26,780.00	දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සිටින නිලධාරින් සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද ඉදිරිපත් කිරීම් (Presentation) පිළිබඳව පුහුණු කිරීම
04.	Workforce Sri Lanka වැඩසටහන යටතේ නිලධාරින් පුහුණු කිරීම	2025.07.30 හා 31	40	30,480.00	දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සිටින නිලධාරින් සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද ඉදිරිපත් කිරීම් (Presentation) පිළිබඳව පුහුණු කිරීම
05.	Workforce Sri Lanka වැඩසටහන යටතේ නිලධාරින් පුහුණු කිරීම (උතුරු පළාත් දෙමළ මාධ්‍ය නිලධාරින් සඳහා)	2025.08.19	48	15,175.00 67,490.00 17,700.00 10,218.00	දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සිටින නිලධාරින් සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද ඉදිරිපත්

අනු අංකය	වැඩසටහන	දිනය	ප්‍රතිලාභීන් ගණන	වියදම	විස්තරය
					කිරීම් (Presentation) පිළිබඳව පුහුණු කිරීම
06.	Workforce Sri Lanka වැඩසටහන යටතේ නිලධාරින් පුහුණු කිරීම (මාතලේ දිස්ත්‍රික් නිලධාරින් සඳහා)	2025.08.20	19	14,500.00	දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සිටින නිලධාරින් සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද ඉදිරිපත් කිරීම් (Presentation) පිළිබඳව පුහුණු කිරීම .
07.	Workforce Sri Lanka වැඩසටහන යටතේ නිලධාරින් පුහුණු කිරීම (රත්නපුර දිස්ත්‍රික් නිලධාරින් සඳහා)	2025.08.26	52	19,600.00 2,900.00	දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සිටින නිලධාරින් සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද ඉදිරිපත් කිරීම් (Presentation) පිළිබඳව පුහුණු කිරීම
08.	Workforce Sri Lanka වැඩසටහන යටතේ නිලධාරින් පුහුණු කිරීම (මධ්‍යම පළාත් නිලධාරින් සඳහා)	2025.08.29	60	41,294.00 4,300.00	දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සිටින නිලධාරින් සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද ඉදිරිපත් කිරීම්. උසස්පෙළ සිසුන් දැනුවත් කිරීම සඳහා (Presentation) පිළිබඳව පුහුණු කිරීම
09.	Workforce Sri Lanka වැඩසටහන යටතේ නිලධාරින් පුහුණු කිරීම (නැගෙනහිර පළාත් නිලධාරින් සඳහා)	2025.09.01	52	66,120.00 2,000.00	දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සිටින නිලධාරින් සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද ඉදිරිපත් කිරීම් උසස්පෙළ සිසුන් දැනුවත් කිරීම සඳහා (Presentation) පිළිබඳව පුහුණු කිරීම
10.	Workforce Sri Lanka වැඩසටහන යටතේ නිලධාරින් පුහුණු කිරීම (දකුණු පළාත් නිලධාරින් සඳහා)	2025.09..26	78	86,245.00 4,930.00	දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සිටින නිලධාරින් සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද ඉදිරිපත් කිරීම් උසස්පෙළ සිසුන් දැනුවත්

අනු අංකය	වැඩසටහන	දිනය	ප්‍රතිලාභීන් ගණන	වියදම	විස්තරය
					කිරීම සඳහා (Presentation) පිළිබඳව පුහුණු කිරීම
11.	2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සම්බන්ධව නිලධාරීන් පුහුණු කිරීම	2025.11.20 හා 21	50	17,013.00 707,072.00	2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති වාර්තා සකස් කිරීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම
12.	2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අවිධිමත් ක්ෂේත්‍රය හා මහජන රැකියා සේවාව සම්බන්ධව නිලධාරීන් පුහුණු කිරීම	2025.11.27 හා 28	30	381,000.00	2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අවිධිමත් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ව්‍යාපෘති වාර්තා සකස් කිරීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම හා මහජන රැකියා සේවාව සම්බන්ධව නිලධාරීන් පුහුණු කිරීම.
13.	2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධව නිලධාරීන් පුහුණු කිරීම	2025.12.30	74	103,950.00 31,115.00	2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම
	වැඩසටහන් ගණන - 13		689	2,544,407.00	

07

පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.6	වෙනත්	අදාල නැත		
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම (මූරෙ445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛණ /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3	විගණන විමසුම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS)පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8	තොග ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9	හානිපාඩු ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		

2.10	බැරකම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛණය(GA-N20) යාවත්කාලින කර පවත්වා ගෙන යාම	අනුකූලවේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූරෙ135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම	අනුකූලවේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූලවේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.4	2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
5	**විගණන විමසුම්**			
	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලවේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණනවාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
7	**විගණන හා කළමණාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත අදාල වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූලවේ		
8	**වත්කම් කළමණාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදි ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පර්ච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලට වාර්තාකර තිබීම	අනුකූලවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක05/2016 අනුව භාණ්ඩ සම්ක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සම්ක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූලවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මුරෙ 772 අනුව සිදුකිරීම	අනුකූලවේ		

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	ආයතනයේ වාහන නඩත්තු ලේඛනය පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.3	ආයතනයේ ඉංධන ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
10.2	සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		
11.2	මුරෙ 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේදි ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූලවීම	අනුකූලවේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූලවේ		
12.3	වර්ෂයකට වැඩිකාලයක සිට පැවත එන හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුරෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදි මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර	අනුකූලවේ		

	මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම			
14.2	මුරෙ 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3	මුරෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මුරෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාලනොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූලවේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූලවේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූලවේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට	අනුකූලවේ		

	වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.			
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**.			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		



9 වන මහල, සෙත්සිරිපාය, දෙවන අදියර, බත්තරමුල්ල.
ටෙලි : 0112 187 160 (අධ්‍යක්ෂ ජනරාල්), 0112 186 405
(සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් අංශය)

9ம் மாடி, செத்சிரிபாய (2ம் கட்டம்) பத்தரமுல்லை. இணையத்தளம்:
தொ.இல: 0112 187 160 (பணிப்பாளர் நாயகம்) 0112 186 405
(திட்டமிடல் மற்றும் முன்னேற்ற தொழிற்பாடு பிரிவு

9th Floor, Sethsiripaya Stage 2, Battaramulla.
Tp : 0112 187 160 (DG Office), 0112 186 405 (Planning and Monitoring Unit)
Web : www.dome.gov.lk